

හමුවුණා...
අනේ හමුවුණා
සුන්දර ආදර කතාව
ජනරංග විජඉදු දේවසුරේන්ද්‍ර

# හමුවුණා..අනේ හමුවුණා

“අපේ ඉසව්ව“ බ්ලොග් අඩවියේ කොටස් වශයෙන් පලවූ ආදරණී  සයිබර් නවකතාව


ජනරඟ විජඉඳු දේවසුරේන්ද්‍ර

www.apeisawwa.blospot.com

*පෙරවදන...*

2011 වර්ෂයේ ජූලි මාසයේ මුලින්ම ''අපේ ඉසව්ව'' බ්ලොග් අඩවියට එහි කුළුඳුල් සයිබර් නවකතාව ලෙසින් පලකල මෙම හමුවුණා..අනේ හමුවුණා නවකතාවට ලැබුණු ප්‍රතිචාර අනුව එය කොතරම් පාඨකයන්ගේ හදවත් වලට ලංවූ නවකතාවක්ද යන්න පැහැදිලි වුණා. බොහොමයක් පාඨකයන් එහි කතා මාතෘකාවට මෙන්ම භාෂා ශෛලියටත් වඩාත් ප්‍රියතාවයක් දැක්වූවා. එහි ප්‍රතිඵලයක් වශයෙන් මගේ මුල්ම නවකතාව ගැන සුවිශේෂ සතුටක් සිතේ ඉතිරි කරන්නක් වුනා.

එසේ සයිබරයේ පලකල නවකතාව පොතක් වශයෙන් පලකරන ලෙස මුලින්ම අදහස ඉදිරිපත් කලේ මීට මාස කීපයකට පෙරයි.ඒ අදහස ඉදිරිපත් කලේ බ්ලොග් අවකාශයේ හිතවත් චතුරංග සහෝදරයා විසින්. භෞතිකව පුස්තකයක් ලෙසට මුද්‍රණය කිරීමට බරපැන දැරීමට ඇති අපහසුව හේතුවෙන් එය විද්‍යුත් පුස්තකයක් ලෙසින් ඉදිරිපත් කරන අවස්ථාවේ මුලින්ම චතුරංග සහෝදරයාගේ අදහස ගැන ස්තූතිවන්තව මතක් කල යුතුයි.

ඒ වගේම මෙම නවකතාව සයිබරයට මුසු කිරීමට විශේෂ ශක්තියක් ලබාදුන් මගේ මිතුරා ධනුෂක් කාලිංග ලියනගේ මෙන්ම බ්ලොග් අවකාශයේ වගේම ''ෆේස්බුක්'' සමාජ ජාලයේ සහ ''ගූගල් බස්'' හීදී මෙම නවකතාව පලකිරීමට දිරිය ලබාදුන් අනුෂ්ක ලක්මාල්,දිනේෂ් උමගිලිය, හිමංෂි හේවාවසම්,ගයාන් කල්හාර, ප්‍රාර්ථනා සෙව්වන්දි වගේම කිඩෝ මල්ලි, නිසුපා සොයුරිය, හංසනී පතිරාජ සහ පන්සල් හන්දිය ලියන සාරංග හැමෝම ආදරෙන් මතක් කර සිටිනවා.

ඒ විතරක්ම නොවෙයි දුරකතන ඇමතුම්, ස්කයිප් ඇමතුම් හා කෙටි පණිවුඩ, ඊ මේල් මගින් දිරිමත් කල හිත මිතුරන් අතර නිසල් සංජීව, සමීර ධනංජය, තෙදූෂිකා ද සිල්වා, සචිත්‍රි ගුණසේකර, හසිනි කල්හාරි ආදරයෙන් මතක් කර සිටිනවා. ඒ වගේම මේ කතාව පිළිබඳ නිරන්තරව ගුණ දොස් පලකල මුදිත හාමුදුරුවන් වහන්සේත් මේ මොහොතේ ගෞරවයෙන් මතක් කර සිටිනවා.

ඒ හැමදෙනෙක්ගෙම ශක්තිය මැදින් රචනාකල මෙම කෘතිය අද විද්‍යුත් පුස්තකයන් ලෙස ඔබ වෙත ඉදිරිපත් කරන්නේ එම මිහිර ඔබටත් බෙදා දෙන අටියෙන්. මෙම සුන්දර ආදර පුවත සංවේදී හදවත් වලට එක්කරනා යමක් ඇත්නම් එම අදහස් මා වෙත යොමු කරන මෙන් ආදරයෙන් ඉල්ලා සිටීමට කැමතියි.

*ජනරඟ විජඉඳු දේවසුරේන්ද්‍ර*

*මාතර*

මාතර කොටු දොරකඩ ලගට ගියෙත් නිකං බාගෙට මැරිලා වගේ. අම්මපා මේ රස්නේ නම්. කියලා වැඩක් නෑ ඉර අතිජාත මිත්‍රයෙක් වගේ ලගටම ඇවිත් දස වද දෙනවා. කණ පැලෙන්න හීතල දවසටනම් මේ ඉර පැත්ත පලාතක් බලන්නේ නෑ මගේ. ඒත් අදනං ඉන්නවා මටම වද දෙන්න. දිසාපති කාර්යාලයට යන්නේ අද ලොකු වැඩක් කරගන්න තියන නිසා. කොච්චර වෙලාවක් ගියත් දෙයියම්පා වැඩේ කරගන්නේ නැතුවනම් එන්නේ නෑ. දවස් ගණනක් තිබුණු වැඩ කන්දරාව නිසා මේකට එන්න වුනෙත් නෑ. ඒත් අදනං කරගෙන මිසක් යන්නෙත් නෑ. හෙමින් හෙමින් කොටුවට ප්‍රධාන දොරෙන්ම ඇතුල් වුනා.

හමුදා කැම්ප් එක ඉස්සරහ මහින්ද විජේසේකර පිට්ටනියේ කොල්ලෝ ටිකක් පුට්බෝල් සෙල්ලම් කරනවා ගිනි කාස්ටකේ. අනේ මුන්ට පිස්සුද මංදා.මුන්ට විතරක් නෙවෙයි එහෙනම් මටත් පිස්සු වෙන්න එපායැ.මීට සතිගාණකට කලින් මමත් මේ වගේම අපේ සෙට් එක එක්ක මෙතන සෙල්ලං කලානේ. වෙනසකට තිබ්බේ අපි ගැහුවේ ක්‍රිකට්. ඉතිං මම හෙමින් හෙමින් ගියා දිසාපති කාර්යාලේ පැත්තට. සතියේ දවසක් නිසා ගොඩක් සෙනග කොටුවේ ඇතුලේ එහාට මෙහාට යනවා. මම නිකමට වගේ රෙපෙරමාදු පල්ලිය දිහා බැලුවා. බලලා ආයෙත් පාරේ අනික් පැත්ත බැලුවා. සුන්දර අහිංසක යුවතියක්...එකපාරටම මම කොහොමද ඒක නිගමනේ කලේ. මගුල තමයි. එහෙම එකපාරටම කියන්න පුළුවන්ද. ඕන සරස්වතී කෙනෙක් කාලි අම්මා වෙන්න යන්නේ තත්පරයයි. ඒත් අනේ මේ කෙල්ල හරි අහිංසකයි. ලස්සන සාරියක් ඇදන් කොණ්ඩෙත් කඩාදාගෙන.වාම් අත් බෑගයත් දාගෙන හෙමි හෙමින් අඩිය තියනවා කොටුව ඇතුලට. දැක්කම ආසාවේ බෑ. මගේ හිතත් මොකද්දෝ වුණා.

එයා ටිකක් වේගෙන් යනවා. මගේ විකාර හිතටත් මේ දහසක් වැඩ තියන වෙලාවේ මේ කෙල්ල පස්සෙන් යන්න හිතුනනනේ. ඉතිං හිතගිය තැන මාලිගාව කියන්නේ නිකංද. කමක් නෑ ටිකක් ගිහිං බලනවා කියලා ගියා පස්සෙන්. අනේ හරි ලස්සන ගමන් ලතාව. රියසකයුරු නිතඹ..කව්සිතුවිලි ගලාගෙන ආවා. අතේ තිබුණු ජංගමේන් හරි මූණු පොතේ කවියක් ලියන්න හිතුනා ඒ වෙලාවෙම. විකාර මටත්..කොහේවත් යන කෙල්ලෙක් පස්සෙන් යනවා මදිවට කවිත් ලියන්න හදනවා.

ටොප් ගියර් එකේ ගියා මදැයි ටිකක් දුර ගිහින් බලද්දි මං ඉන්නේ කොටුව මැදි නුග ගහ ලග හංදියේ. මගේ විකාර හිත මාවත් අරගෙන රූබර අහිංසක යුවතිය එක්ක මාවත් අරගෙන දිසාපති කාර්යාලේ පහුකරගෙන ඇවිත්. මෙතන තියෙන්නේ මැතිවරණ කාර්යාලේ. මොකද නාම යෝජනා බාර දෙන්නද..... එපාර හිත කියනවා ඔච්චර ආපු එකේ තව ටිකක් පලයන් කියලා. ඉතිං මමත් යනවා. මම දැන් එයාට ගොඩක් ලගින් යන්නේ.

මෙහෙම ගියපු සොදුරු රුවැත්ති තමන්ගේ අත්බෑගේ දුන්නා....කාටද ?කොටුවේ කඩේ බෑග් කවුන්ටර් එකට. දීලා එයා ආපහු ආවෙ මගේ පැත්තට. ඒ මට ලංවෙන් න නෙවෙයි මං පහුකරලා කොටුවේ කඩේට ඇතුල් වෙන්න. මමත් ඉතිං මගේ හිතත් තුරුල් කරන් ගියානේ එයාගේ පස්සෙන්. යකෝ දහසක් වැඩ තියාගෙන මම කරන දේවල්..ඕකට කියන්නේ හිතට වහල් වීම.

ගැණු ලමයෙක් කොටුවේ කඩේට ඇතුල් උනාම පුරුදු විදියට ඇහැයන සෙන්ට් පවුඩර් තියන තැනට එයා ගියා. මාත් ගියා. එයා සෙන්ට් තෝරනවා. මම ෆේස්වොෂ් තෝරනවා. එයා අන්තිමට ගාඩිනියා සුවද සෙන්ට් එකක් අතට ගත්තා..දෙයියනේ ඒක මමත් හරි ආස බ්‍රෑන්ඩ් එකක්නේ. මෙහෙම වෙන්නේ හොදකට නෙවෙයි යකෝ...හිත පිස්සු නටනවා..මමත් ඔන්න මොකක්දෝ එකක් අතට ගත්තා වගේ මතකයි.

ඊට පස්සේ එයා ගියා රෙදි තිබුණ පැත්තට. එයා එක එක ඒවා තෝරනවා. මම ඉතිං එතන ඉන්න බැරිනිසා ටිකක් මෙහාට වෙලා එක එක ඒවා තෝරනවා. මම ඒ අතරේ බැලුවා ඒ පුංචි මූණු පොඩ්ඩ දිහා.. මාරයි...මාරම මාරයි..ලස්සන ඇස්දෙක..නිල් මැණික් දෙකක් වගේ..ලස්සන තොල්දෙක රෝස මල්පෙති

වගේ..ලස්සන නහය මොකක් වගේද? නෑ උපමාවක් ආවේ නෑ..මං උපමා කිරිල්ල නැවැත්තුවා. ඇත්තටම එයා සුන්දරයි. ඔන්න මට ආයෙත් කවියක් ලියන්න හිතෙනවා..

මම විකාර කර කර එක එක ඒවා තෝරනවා. ඒ අතරේ මං ලගින් පුංචි හඩක් ඇහුනා.

‘‘...එක්ස් කියුස් මී...අයියා...‘‘

මම හැරුණා පිටිපස්සට...දෙයියනේ අර රුවැති මල මගේ ඉස්සරහා..හරි සුන්දර හිනාවක් එක්ක.මම මගේ වම් අතින් කකුල කොනිත්තලා බැලුවා හීනයක්ද කියලා...ඌයි රිදුණා මටම...නෑ හීනයක් නෙවෙයි...මම කන්න වගේ එයා දිහා පුදුම වෙලා බලන් හිටියා.

.‘‘..එක්ස් කියුස් මී අයියා...‘‘

එයා ආයෙත් කිව්වා.

‘‘එක්ස් කියුස් මී අයියා...‘‘

ඇය මොනවාදෝ කියනවා දැනුනත් ඒ කිසිදෙයක් ඇහුණේ මට නොවෙයි. රුවැත්තියගේ රුවට මම වශීවී සිටීම එයට හේතුවිය. අවසානයේදී මට වචන සොයාගත හැකි විය.

‘‘ඇයි නංගි....‘‘

මම යන්තම් වචන ගලපාගෙන ඇසීය.

‘‘අනේ අයියේ මේ මගේ පර්ස් එක අරින්න බෑ..චුට්ටක් ඇරලා දෙනවද..මම බැලුවා ගොඩක් අමාරුයි...‘‘

දෙවියන් යමක් දෙනකොට දෙන්නේ ටොකු ඇණ ඇණ උඩ පැන පැන යන්න සනාථ කරමින් සොදුරු රුවැත්තිය මගේ නෙත් ඉදිරිපිටටම පැමිණ ඇත. වහා ඇයට උදව් කිරීමට මම ඇගේ පසුම්බිය අතට ගතිමි. දැඩිවෙර දමා විවෘත කිරීමට උත්සහ කලත් විවෘත නොවිණි. ඇය මහත් වුවමනාවෙන් සට සට ගා දගලන මගේ ඇගිලි තුඩු දෙස බලා සිටියාය. මගේ ඇගටද දාඩිය දාන්නට වූයේ එයත් සමගය.. අයියෝ මේ මගදාව ඇරෙන්නේ නෑනේ..වස ලැජ්ජාවේ පණයනවා මේකි ඉස්සරහ...

‘‘අමාරුනම් කමක් නෑ අයියා...‘‘

ඇයට මම විදින දුක තේරීදෝ අහිංසක මූණට හීන් හිනාවක් නගාගෙන කීය. ඒත් මම අතාරිනවද එහෙම වැඩක්...යංතං දගලා පසුම්බිය නොකඩා විවෘත කරගැනීමට හැකිවිය.වාසනාවකි.

‘‘ආ මෙන්න නංගි...මම හිතන්නේ සිප් එක හිරවෙලා...‘‘

මම ඇගේ රන් වන් පැහැ සුරතට පසුම්බිය බර තැබීය. ඇය සිනාමුවින් මා දෙස බැලීය.

“තැන්ක්ස් අයියා... “

වචන දෙක පවසා ඈ මවෙතින් ඉවත් වී මදක් එහාට ගොස් පසුම්බිය විවෘතකර රෙදි කැබැල්ලක් එළියට ගත්හ. එය තබා එයට ගැලපෙන රෙදි සොයන ඈය දෙස සිනාපිරි මුවින් මම මොහොතක් බලා උන්නෙමි.

ලියන්න පුළුවනි මට දහසක් කවි...
බලා ඔබ දෙස තත්පර ගණනක්...
ගයන්න පුළුවනි ගී ගඟුලක් මට...
සවන් යොමා ඔබෙ එක වදනකට

කාව්‍ය සංකල්පනා ඉබේ පහලවේ.ටික වෙලාවක් ඈ දිහා හොරෙන් බලා සිටියේ දමා යන්නට ලෝබ කම නිසාම වන්නට ඇති. මම තෝරපු ඇඳුමකුත් නැත එහෙත් හිතපුරා නෙත්පුරා ඒ රුවැත්තිය අහිංසක සොඳුරු හිතැත්තිය මම බලාගතිමි.

දුරකතනය නාදවිය...අතට ගෙන ඇමතුමට සවන් දුන්නෙමි මම

“හෙලෝ අම්මේ...“

“සුදු පුතේ...මොකද වැඩේ කරගන්න පුළුවන් උනාද..“

ආ වැඩේ මතක් වූයේ එවිටමය..සොඳුරු රුවැත්තිය පසුපස පැමිණ මට මගේ වැඩද අමතක වී ඇත. අනේ මගේ විකාර හිත..අම්මට අමාරුවෙන් හරි බොරුවක් කියන්නට විය.

“තාම නෑ අම්මා..මම මේ ඒ.ජී ඔපීස් එකේ ඉන්නේ...“

“හා හොදයි සුදු පුතා පරිස්සමින් එන්න...“

දුරකතනය තබා මම දිගු සුසුමක් හෙලා නැවත ඈය දෙසම බැලීය. යන්නද කෙසේ දමා නුඹේ අහිංසක නෙත්..අයියෝ ආයෙත් කවි හිත පත්තු වෙන්න කලින් යා යුතුය..

ආයේ කොයි මොහොතේ හෝ මාතර නගරයේදී ඈය හමුවේදෝ..ඒවා අවිනිශ්චිතය..ඈය හා කතාකර තතු දැනගන්නටද හිතේ ධෛර්යයක් නැතුවා මෙන්ය...අවසානයේ හිත හදාගෙන ඈය වෙතට යන්න හදද්දිම ඈය ත වත් යුවතියක් සමගින් කතාකරමින් උඩුමහලේ පියගැට පෙල තරණය කරයි. මා ඈය දෙස බලත්ම ඈය සිහින් සිනාවකින් සංග්‍රහ කලාය...එයම ඇති මට දැන් යන්නට..ඒ කවදා හෝ නැවත අප හමුවන බවේ සංඥාවයි...

මම කොටුවෙ කඩේන් එළියට ආවේ අතට ගත් පේස් වොෂ් එකට බිලද ගෙවාය..දඩි බිඩියේ දිසාපති කාර්යාලය දෙසට දිව්වේ හති දමමිනි...දවල් නොකා හවස් වරුවද කැප කරමින් මම යංතං වැඩේ කරගෙන ගෙදර යන්නට බස් නැවතුමට ආවේය..

එස්.කේ් එක පැත්තෙන් යන්නට ආ නිසා මගදීම ගන්දර බස් රථයක් මුණ ගැහුණි. මැද්දවත්තට ටිකට් එකත් අරගෙන බස් රථයේ ඉදිගත්තේ සොදුරු රුවැත්තියත් හිතට බර කරගෙනමයි...අනේ අද මරු දවසක්නේ අම්මපා

****************************************************

හා හා පුරා කියා මෝටර් රථයක් ගත්තේ දහසක් පෙරුම් පුරාය. විධායක ශ්‍රේණියේ රැකියාවකට ගොස් වසර කීපයක් ගතවුණත් මගේම කියා වාහනයක් නැතිවීම මහා පාඩුවක් විය. අවසානේ මගේ ඒ ආසාව ඉටුකර ගැනීමට හැකිවුයෙ අතේ එකතුකල මුදල් හා ලීසිං වලට පිංසිද්ධ වෙන්නය.

මගේ සොදුරු ඇල්ටෝ රථය පඹුරණ ඒ.එම්.ඩබ්ලිව් අංගනයෙන් එළියට ගෙන ගාලු පාරට දාද්දී හිතට දැනුනු සතුට කියා නිමකරන්නට බැරිය. අනෙක් අසුනේ වුනේ මගේ අතිජාත මිතුරා නිසල්ය. නිසොල්මනේ මගේ සතුටට ඔහුද හවුල් විය.

දින දෙකකට පසු අම්මා තාත්තා අක්කා හා නිසල්ද සමගින් මුල්කිරිගල ගියේ වාහනයේ මුල්ම ගමන ලෙසින්ය. කව්රුත් කීවේ කතරගම යන්නට කියාය. අපිට කියා ගෞතම බුද්ධ සාසනයක් තියෙද්දී මොකටද හින්දු ආගමට පේ වෙන්නේ. මගේ අදහස තාත්තාද අනුමත කල නිසා මුල්කිරිගල ගමන ස්ථිර විය. බොහොම විනෝදෙන් අපි ගමන ගොස් ආවෙමු.

ජීවිතයේ තවත් කඩඉමක් පසුකරන මොහොතේ හද්ස්සියේම මට සොදුරු රුවැත්තිය සිහිවිය..අනේ එයා කොහේ ඇද්ද...කමක් නෑ මම කවදාහරි එයාව හොයාගන්නවා..මුල්කිරිගලදී මම සිතින් එයට දිරිගත්තෙමි..එයා මාතර මමත් මාතර...මේ මාතර අපිව මග ඇරෙන්න විදියක් නෑ...

ආපසු ගෙදර එද්දී රෑ වූ බැවින් සියල්ල ඉක්මනින් කා බී නින්දට වැටුණි. දික්වැල්ලෙන් නිසල්ද ගෙදරටම බස්සවා ආවේ අතිජාත මිත්‍ර සෙනෙහස අතිප්‍රබල හෙයිනි.

රෑ නින්දට වැටුණේ මහන්සිය තද නිසාය. එහෙත් හිත සතුටින් පිරී ඇත. බොහෝ දේ ජීවිතයේ ලැබී ඇත..හොද පවුලක්..නෑදෑ හිත මිතුරන් පිරිසක්..හොද රැකියාවක්..උරුමයෙන් ලද නිවසක්...දැන් වාහනයක්...අඩුව ඇත්තේ හිතේය...හිත ලග කව්රුත් නැති වීමය...අනේ සොදුරු රුවැත්තියේ උඹ එන්නකෝ ඒ පාළු හිතට...නිකම්ම ඒ සිතුවිල්ල හිතට කාන්දුවිය..කොට්ටය බදාගෙන ඇදේ පෙරලුනේ හිත ඒ සිතුවිල්ල තදින් බාරගත් හෙයිනි.

මිතුරෙක්ගේ සාදයකට දවසක් හැන්දෑවේ තිහගොඩට යන්න සිද්ධවුණා. යාළුවන්ගේ සාද කිව්වම කොටත් සමහර වෙලාවට එපා වෙනවා එහෙම කියලා යාළුවෝ නැතිකරන්නත් බෑනේ. ඒක නිසා වාහන පොඩ්ඩත් පදවගෙන මාතර හරහා යන්න ආවා. පල්ලිමුල්ල හරියෙන් වාහනේ පදවගෙන එනකොට පුරුදු විදියට මොනැකෝ ක්ලාස් එක ඉවරවෙලා යන ගෑනු ළමයි පිරිමි ලමයි පේලියට බස් නැවතුම පැත්තට යනවා. අනේ අනේ මමත් ඔහොම ගිය හැටි මතකයි..මට හොද හැටි මතකයි...

බස් නැවතුම පහුකරද්දි හවස හතර පහුවෙලා මිනිත්තු තිහක් ගතවෙලා කියලා හිරු අභියසේ ෂානු අක්කා කිව්වා. ඔහොම හිමින් සීරුවේ වාහනේ පදවගෙන බෝධිය ගාවින් හරවද්දිම හොදට පුරුදු රූපයක් දැක්කා හක්මණ පාරේ බස් හෝල්ට් එකේ. ඒ රූපේ හොදට හුරුයි කියලා දැනෙන කොටත් වාහනේ බස් හෝල්ට් එක පහුකරලා මහජන බැංකුව හරියටම ගිහින්. ඒත් නොබලම යන්න හිත දුන්නේ නැති නිසා හිමින් සීරුවේ රිවස් එකට ආවා..එනකොටයි පැති කණ්ණාඩියෙන් දැක්කේ මගේ හීන රුවැත්තිය බැබලි බැබලි ඉන්නවා දොස්තර එස්.වික්‍රමසිංහ පිළිරුව ගාව. දෙයියනේ මම මුල්කිරිගල ගිහින් මේ කෙල්ලව ආයෙත් මුණ ගස්සන්න කියලා කියලා දවස් කීයද ගියේ. අපේ දෛවය කොච්චර අපිත් එක්ක පිස්සු නටනවද කියලා හරියටම දැනුනේ අද තමයි.
හිමිහිට වාහනේ සම්පත් බැංකුව ඉස්සරහා නවත්තලා ඉක්මණින් දිව්වා බස් හෝල්ට් එකට. හිත සතුටින් පුපුරන්න වගේ. ඒත් රුවැත්ති බස් එකට නැගලවත්ද? හිතට පුංචි බයක් ආවා..නෑ ඉන්නවා හෝල්ට් එකේ..පුරුෂ ශක්තිය ඇගට අරන් ගියා ලගට..එයා බැලුවා මාව දවා අලු කරන බැල්මක්..

“..නංගිට මතකද මාව...“

අතේ තිබුණු යතුර සාක්කුවට දාගෙන හිමිහිට ඇහුවා..එයා ටිකක් බයවුණා වගේ. හරි සැකෙන් වගේ බැලුවා මගේ දිහාව..

“...ම්ම්ම්ම්...මතක නෑනේ...“

එච්චරම සුහදශීලී නොවුණත් හරිම අහිංසක විදියට කිව්වා...

“...දැන් සතියකට විතර කලින් කොටුවේ කඩේදි...අර..අර..ඔයාගේ පර්ස්  එක ඇරෙන්නේ නැතුව...හෙණ ගේමක් දීලා ඇරලා දුන්නේ...“

මම කියපු විදයටද මංදා නැත්නම් ඒක අරින්න මම විදපු දුක මතක් වෙලාද මංදා අහිංසක මූණට මාර හිනාවක් ආවා..එයා ඇදන් හිටියේ සාරිය නෙවෙයි.දිග සායට රෝස පාට අත්කොට බ්ල්වුස් එක..හරිම අහිංසක පෙනුමක් එයාට ඇවිල්ලා තිබුණා.ඒත් එයාට ඕනම ඇදුමක් ලස්සනයි කියලා මට හිතුණා...

“...හරි හරි මට මතකයි..තැන්ක්ස් අයියා...මට එකපාරටම මතක් වුණේ නෑ...“

‘‘..ඒකට කමක් නෑ නංගි…ඔයා මේ ගොම්මන් වෙලාවේ තනිපංගලමේ කොහේද යන්නේ…‘‘

එච්චර හොඳනැති මගේ කට කියවන ඒවා මටම පාලනය කරගන්න බැරිවයි තිබුණේ.

‘‘…මම ගෙදර යන ගමන් අයියා…‘‘

එහෙනම් ගෙදර තියෙන්නේ මේ පැත්තේ. දවස් ගාණක් තිස්සේ මගේ හිත අහන ප්‍රශ්න එකින් එක දැන් සම්පූර්ණ වෙනවා..

‘‘…හක්මණ පාරේ ගොඩක් දුරද නංගි ඉන්නේ…‘‘

මමත් ඉතිං ඇහුවේ ගෙදර එන්න වගේ..

‘‘..නෑ ටිකක් ලග…‘‘

කියපු විදියෙන්ම මට තේරුණා ගෙදර තියන තැනනම් කියන්නේ නෑ කියලා. ඇරත් වැදගත් කෙල්ලෙක් එකපාරටම කොල්ලෙක්ට ගෙදර තියන තැන කියයිද..

‘‘..යං නංගි මාත් යන්නේ තිහගොඩට..ඊට මෙහායින් බහිනවනම් මාත් එක්ක යන්න පුළුවන්…‘‘

පැනලා කිව්වට එකපාරටම සොඳුරු රුවැත්තිගේ මූණ වෙනස් වුණා. උත්තර දෙන්නේ කොහොමද කියන්න වගේ..ඒත් මට තේරුණා එහෙම කියපු එක එච්චරම හොඳ නෑ කියලා.

‘‘..නෑ අයියා මම බස් එකේ එන්නම්..තැන්ක්ස් අයියා…‘‘

කෙල්ල ලැජ්ජාවෙන් වගේ කිව්වා. කමක නෑ දෙයියනේ උන්න හැටියට මලා මදෑ..ටිකක් කතා කලා හරිනේ..

‘‘…ඕකේ නංගි…ඒක නෙවෙයි ඔයාගේ නම මොකක්ද..? ‘‘

කෙල්ලගේ මූණට ලැජ්ජාවෙන් බරවුණු මල් හිනාවක් ආවා..පුංචි රතුපාට තොල් හොලවලා

‘‘..මම ඉරුදිකා…‘‘

හෝ ඉරුදිකා..ලස්සන නම. මට එහෙම හිතුනා. අනේ ඉරුදිකා ඔයාට මගේ ඉර වෙන්න බැරිද මේ කළුවර ජීවිතේට..විකාර..

‘‘..මම සදීප…‘‘

ඉරුදිකා ලස්සනට හිනාවුණා. ඒත් එක්කම කඹුරුපිටිය බස් එකක් ආවා.

"...එහෙනම් මම යන්නම් අයියා...බුදු සරණයි..."

"...බුදු සරණයි නංගි..පරිස්සමින් යන්න..සී යූ..."

එයා හැරිලා බැලුවෙත් නෑ..මොකුත් කිව්වෙත් නෑ. හිත ටිකක් සැලුණා.ඒත් මේ සදීප සැලෙනවද එහෙම. දුවලා ගිහිං නැග්ගා ඇල්ටෝ පොඩ්ඩට. දැම්මා තියන ගියර් සේරම. ගියා බස් එක පස්සෙන්.

දැන් හෝල්ට් එක හෝල්ට් එක පහුවෙනවා.මම කාර් එකේ බස් එක පස්සෙන් යනවා. නවත්තන හෝල්ට් එකක් ගානේ බලනවා ඉරුදිකා බහිනවද කියලා. ටිකකින් බස් එක තුඩාවේ තෙල් පිරවුම්හල ගාව නැවැත්තුවා. බැස්සා මගේ හීනෙට බැහැලා හිටපු කුමාරිය ඉරුදිකා..බැහැලා ටිකක් වෙලා පාර අද්දර හිටියා. මම කාර් එක ටිකක් මෙහායින් නවත්තගෙන බලං හිටියා. ටිකකින් එයා පාර මාරුවෙලා හිමින් හිමින් ඉස්සරහට ගිහිං හැරුණා නැදුන් උයන පාරට..

තුඩාවේ ඉන්නේ සැර ජනතාවක්. පොඩ්ඩ ඇත්තන් අතක් පයක් ගලවනවා. තුඩාව ගැන මගේ මිත්‍රයෙක් කිව්ව කතාවක් මට මතක් වුණා. තුඩාවට නෙවෙයි ඕක මුළු මාතරටම පොදුයිනේ. මමත් මාතර එකානේ.

ටිකක් පාරට හැරෙන තැනට ලංකරලා බලං හිටියා. හිමින් හිමින් ගියපු ඇය හතරවෙනි ගෙදර ගාවින් දකුණට හැරුණා. මම හිතුපු විදියට ගෙදර තිබුණේ ප්‍රධාන පාරේ නෙවෙයි. ගේ බලාගන්න ඕන නිසා කාර් එක හරවන් නැදුන් උයන පාරදිගේ අර අතුරු පාර ගාවට ගියා. ඒ අතුරු පාරේ දෙවනිගේ ගේට්ටුව ඇරගෙන ඉරුදිකා ඇතුලට ගියා. හරි දැන් ගේ දන්නවා. මේ ලග පාත කෙල්ලෙක්නේ.

පස්සේ බලමුකෝ ඉතුරුවා කියලා හරවගත්තා කාර් එක. ඊට පස්සේ හිතින් එයාව තුරුල් කරන් ගියා තිහගොඩ පැත්තට.

ආදරේ කියන අකුරු ටිකේ තේරුම මට හරියාකාරව දැනිලා තිබුණේ නෑ. ඒත් දැන්නම් ඒක ඇතිවෙන්න දැනෙනවා. ඉරූ...මම ඔයාට ආදරේ කරනවා...ඉරුදිකා මම ඔයාට ආදරෙයි කියලා කෑ ගහලා කියන්න පුළුවන් තරමට හිත දගලනවා. ඒත් දෙයියනේ මම එයාට ආදරේ කලාට එයාට කව්රුවත් ලංවෙලා ඉන්නවද..එහෙමත් නැත්නම් එයා මට කවදාවත් කැමති වෙන එකක් නැද්ද කියලා මම කොහොමද දන්නේ. ඒකත් ඇත්ත..හදිස්සිවෙන එක හොදනෑ..හැමදේම හොයලා බලන්න ඕන හොදට..

හිතේ දගලන පෙම් කතාව ලියන්න ටිකක් ප්‍රමාදවෙයි වගේ කියලා මට දැනෙන්න පටන් ගත්තා. ආයෙත් හමුවුණොත්..අම්මපා දෙකෙන් එකක් දැනගන්නවා..මොකක්ද දෙක..කැමතිද අකමැතිද කියලද? නෑ..තනිකඩද දෙකඩද කියලා. හිත මාත් එක්ක තර්ක විතර්ක කරනවා රෑ ජාමයක් වෙනකම්ම. ඉරුදිකා මගේ හිතට කොච්චර බලපෑමක් කරනවද කියලා දැන් තමයි දැනෙන්නේ.

රෑ තිස්සෙ නින්ද යන්නෙත් නෑ. හීනෙන් පේන්නෙත් සොදුරු රුවැත්තියම තමයි.ඉතිං රෑට නින්ද යන්නේ එයාව හිතේ තියාගෙන උදේට නැගිටින්නෙත් එහෙමමයි. ඔයා මේ ජීවිතේට එනකම් මේ ජීවිතේ හරි පාළුයි ඉරූ..

දවස් කීපයක් ගෙවිලා ගියා. ඉරුදිකාගේ මතකය හිතේ හොදට ඇදිලා තියනවා. නොමැකෙන්නම. පඩි දවස ආවා. පඩි අතට ආවම අවශ්‍යතා ඉබේම මතුවෙනවා. යටවෙලා තියන අවශ්‍යතා එලියට එන්නේ එදාටනේ. කලිසම් කීපෙක ඌනතාවෙන් පෙලිලා හිටපු මම කිංස්වත්තට ගියේ පුරුද්දකට වගේ.

මැරිලා මැරිලා යන්තං ප්‍රභාත් එකෙන් ඇදුම් ටිකක් ගත්තා. බිල දැක්කම අපි ආදි වාසී ජනතාව වගේ කොලඅතු එල්ලගත්තනම් කොච්චර සැපද කියලා දැනුනා. කොහොමින් කොහොම හරි හවස් වෙලා තිබුණට මාතරට පුරුදු විදියට ඉර තර්ජනය කරමින් හිටියා. හොදටම මහන්සියි. දිව ගිලෙන්න වගේ වතුර තිබහට. අයිස්ක්‍රීම් කරත්තයක් තිබුණත් ඒ සරතැස නිවන්න අයිස්ක්‍රීම් මදිවගේ දැනුණා. අඩියක් දෙකක් ඉස්සරහට ගියා ලවර් එක පහුකරලා. ඉස්සරහින් තියනවා ෆ්ලොරන්ස් එක. හිතුවා මොනවාහරි සීතලට උගුරට දාගන්න. පුදුම හදිස්සියකින් ෆ්ලොරන්ස් එක ඇතුලට ගිහින් බිල ගෙවලා ගත්තා දොඩම් යුෂ එකක්. උගුරයි බිච්චේ බාගෙට නිවන් ගියා වගේ. ඒත් මේ මද්දහනෙත් ගෑණු ලමයි කිසිම අමාරුවක් වෙලාවක් නැතුව ෂොපින් කරන විදිය දැක්කම පුදුම හිතුනා. සිල්වත් කමක් නැති මගේ ඇස් දෙක දිව්වා ෆ්ලොරන්ස් එක පුරාවටම. .

දෙයියනේ ඇත කෙලවර තනි මේසෙක වාඩි වෙලා කූල් එකක් සප්පායම් වෙන සොදුරු රුවැත්ති...ඉරුදිකා...දැක්කා මගේ පින්වත් ඇස් දෙක. ඇයි දෙයියනේ මේ ටොකු ඇණ ඇණ දෙන්නේ..මෙහෙම කරන්නේ නම් හොදකට නෙවෙයි. මට එයාව දකින්න ඕන කියලා තදින්ම දැනෙනකොටම එයා මගේ ලගනේ..මේකට තමයි දෛවයේ විකාර කියන්නේ. මම හිටපු මේසෙන් නැගිටලා විදුලිය වගේ ගියා එයා ගාවට..ඒත් දැක්කේ නැතුව වගේ එයා ගාවට ගිහින් එකපාරටම පුදුම වෙලා බැලුවා. ..

“...මේ ඉරුදිකා නංගි නේද?...“ .

එකපාරටම පුදුම වෙලා වගේ නම ඇහුණු පැත්ත බලපු කෙල්ලගේ මූණ හරි ලස්සන හිනාවකින් විකසිත වුණා. ඔන්න මගේ හිතට ආයෙත් කවි එනවා. .

හිනාවෙන තරමට විඩා .
නිවයිමා හද .
කුමට මට දොඩම් යුෂ .
දෙන්න හිනාව හදටම .

ඔය විකාර කවි හිතට එද්දිම එයත් කතාකලා අර සුපුරුදු සුන්දර හඩින්ම .

“...මේ.....සදීප අයියා නේද...“ .

මගේ හිතේ මල් කලඹක්ම පිපුණා. ඒකියන්නේ කෙල්ලට මාව හොදට මතකයි. දෙපාරක් දැකලා නම හොදට මතක තියනවා කියන්නේ හොද ප්‍රගතියක් තියනවා. .

කොහොමත් මාතර කොල්ලෝ ආදරේ හරි ඉක්මණට හිත්වල රන්දනවා. ඒකටම හරියන ආදරයක් ලැබුණොත් ජීවිතේම ඒ ආදරේට දෙනවා..ඒත් ඒ ආදරේට බොරුවක් කලොත් මාතර කොල්ලෝ නිකං ඉන්නෙත් නෑ...ඒ මාතර ආනුභාවය මාතර කෙල්ලෙක්ටම මුදාහරිද්දි යම් අවදානමක් තිබුණත් ඉරුදිකාගේ මතකයේ මගේ රැදීම ඇත්තටම මාරයි.. .

“...ඔයාට එහෙනම් මාව මතකයි...මොකද මේ කරන්නේ අද..?? “ .

මම දොඩම් යුෂ වීදුරුවත් අරං එයාගේ මේසයේ ඉස්සරහ පුටුවෙන් වාඩිවුනා. ඉරුදිකා හරි මහන්සි පාටකින් හිටියේ. .

“...යාළුවෙක් එක්ක ෂොපින් ආවා...එයාගේ වැඩකට...ඒ ගමන් මමත් ගත්තා...යාළුවා ගෙදර ගියා මමත් දැන් යන්න කියලා..“ .

සුන්දරම හිනාවක් මූණෙ තියාගෙන හරි හුරතල් විදියට කිව්වා. එහෙම කියද්දි ඉරුගේ ඇස්දෙක දිහා බලන් ඉන්න ආසයි...ලස්සන ඇස්දෙක ලග මොහොතක් නවතින්නට- අවසරදැයි කියන්න...මට එහෙමත් කියන්න හිතුනා. .

“...මාත් ආවා නංගි බඩු වගයක් ගන්න..මාත් යන ගමන්.. “ .

කෙල්ල හීනියට හිනාවුණා...මම ටිකක් ඉවසලා බලං ඉදලා කෙල්ලගෙන් ඇහුවා හීන්දාඩිය දාන ප්‍රශ්නයක්

“...නංගි තුඩාවේ නේද?..“ .

කෙල්ල ඒපාරනම් ටිකක් බයවුණා. මූණෙ තිබුණේ වික්ෂිප්ත වුණු ස්වභාවයක්.ඒත් එක ටිකක් මගඇරලා වගේ මගෙන් ඇහුවා .

“...අයියා කොහොමද දන්නේ..“ .

ඉතිං ඔන්න ඉතිං සිල්පදයක් කඩාගෙන යන්න වුණා. .

“...දවසක් මම තුඩාව හරියෙන් එද්දි දැක්කා ඔයා ඉන්නවා.“ .

කෙල්ල මම දිහා බැලුවේ නිකං මම එයාගැන හොයනවා වැඩියි කියන්න වගේ...ඒත් මූණ හදාගත්තා ඉක්මණටම සාමාන්‍ය විදියටම .

“..ඔව් අයියා හන්දිය ලගමයි ඉන්නේ..“ .

ඉතිං දෙන්නම ටිකක් හිනාවෙලා විස්තර කතාකර කර හිටියා. අදනම් මෙහෙම ගැලව්ලා යන්න දෙන්න

බෑ. අඩුම ගානේ නම්බර් එකවත් ඉල්ලගන්න ඕන. ඊට පස්සේ අලගිය මුලගිය තැන් සේරම දැනගන්න පුළුවන් එයාගෙන්ම. ඒත් එකපාරටම නම්බර් ඉල්ලුවට දෙනවද මේ නිල්වලා නිම්නේ කෙල්ලෝ. අපෝ එහෙනම් ලෝක පුදුමයක්. ඒක නිසා බිම බලාගෙන දොඩම් යුෂ එක බොන ගමන් උප්පර වැට්ටියක් කල්පනා කලා. ඔළුවට ආවා නියම අදහසක්. .

"...නංගි මට පොඩි උදව්වක් කරන්න පුළුවන්ද?." .

කෙල්ල පුදුම වෙලා වගේ මම දිහා බැලුවා. .

"...කියන්න අයියේ..පුළුවන් දෙයක් නම් කරන්නම්.." .

ඔන්න ඉතිං උප්පරවැට්ටියේ පලමු පියවර හරි.දැන් දෙවන පියවර. .

"...නංගි මගේ යාළුවෙක් කමිනියුකේෂන් එකක පටන් ගන්නවා දෙවුන්දර..ඒකට හොඳ ඒවගේ වැඩ දන්න ගර්ල් කෙනෙක් හොයලා දෙන්න..මගේ යාළුවා නිතරම ඉන්නේ පිට..ඒක නිසා කමිනියුකේෂන් එක බලාගන්න විශ්වාසවන්ත ගර්ල් කෙනෙක් ඕන..මම හෙව්වා තාම හොයාගන්න බැරිවුණා...ඔයාගේ යාළුවෙක් හරි දන්න කෙනෙක් හරි ඉන්නවනම් කියන්න.." .

බොරුවක් කියන්න කටට ආවත් මේනම් කිව්වේ ඇත්තමයි. නිසල් දෙවුන්දර කමිනියුකේෂන් එකක් පටන් ගන්න සේරම ලේස්ති කරලා කෙල්ලෙක් නැතුව දුක් විදිනවා. මම තැනේ හැටියට ඇණේ ගැහුවා.

"....හ්ම්...මගේ මතකෙටනම් එහෙම කෙනෙක් එන්නේ නෑ..ඒත් අයියේ මම හොයලා බලලා කියන්නම්..."

කෙල්ල පුංචි හිනාවක් දාගෙනම් කිව්වා. විද්ද ඊතලේ නියම තැනට වැදුනා. දැන් අවසන් පියවර. ගත්තා පර්ස් එක. එලියට ඇද්දා මගේ කාඩ් එක..තාම කුඩු නොවී තියන එකක් අරන් දුන්නා ඉරූ අතට.

"...නංගි මේ මගේ කාඩ් එක...අනේ හොයලා මගේ මොබයිල් එකට කෝල් එකක් දීලා කියන්න..ලොකු උදව්වක්..."

කෙල්ල කාඩ් එක ගත්තේ සර්පයෙක් අතට දීපු ගාණටයි. ඒත් අරං දාගත්තා බෑග් එකේ පොකට් එකට.

"...හරි අයියා මම කියන්නම්.." .

වැඩේ හරිය. ඒත් කෙල්ල කතාකරන්නේ කෙනෙක් හමුවුණොත්ය. නැත්නම් කතා නොකර ඉදීවිද? එහෙම වුණොත් සියල්ල සුන්ය. .

"..කෙනෙක් හොයාගන්න බැරිවුණොත් මට කියන්න නංගි.." .

මම ඊලග තුරුම්පුවත් ඇද්දේය. .

"...ඕකේ අයියා...මම කියන්නම්." .

දැන් සියල්ල හරිය. අද ගෙදරින් බැහැපු වෙලාව හොඳය. මම දොඩම් යුෂ අවසන් කරමින් ඇය දෙස හොරෙන් බලා සිටියේය. යන්නටවත් හිත ඉඩනොදේ. එවිටම ඇගේ ජංගම දූරකතනය නාද විය.

''...හෙලෝ...ආ...එහෙමද...අනේ චුට්ටක් ඉන්න...මම එනවා...ඔන්න යන්න එපා..අනේ සොරි..මම එනවා...''

ඇය කලබලෙන් සමාව අයදින ස්වරයෙන් දූරකතනයට පිළිතුරු දුනි. කව්ද ඒ? කව්ද මගේ ඉරු එනකං බලං ඉන්නේ..අනේ දෙවියනේ මට මගේ ඉරු කියන කැල්ල ඉවත්කරගන්න වෙලාද? ඇරඹුමම කඳුලක් වෙලාද..මට මොනවාද වුණි. .

ඇය ඉක්මණට බීම එක හිස්කලහ. මමත් නිසොල්මනේ හැගුම්බරව බලාසිටියේය. මගේ හිත එකපාරටම කළුවිය. ඇය අසුනින් නැගිට්ටාය. .

''...සොරි අයියේ..මම යනවා එහෙනම්..මම අරක කියන්නම්..බුදු සරණයි'' කියා...යන්න ගියාය.

එක සැරයක් වත් ආපුසු නොහැරුනු ඇය ප්‍රශ්න ගොන්නක් මගේ හිතට දී යන්නට ගියාය. ඉක්මණින් ෆ්ලොරන්ස් එක ලගින් බ්‍රෝඩ් වේ පාරට බැස්ස ඇය බෝධිය පැත්තට ඉක්මණින් යන්න ගියාය.

මා හිත මහා පාළුවකින් හා ක්ෂණිකව ඇතුලුවූ බියකින් පෙලිනි. මහා ප්‍රශ්න ගොඩක් මා හිතේ කැරකේ..කෙසේ විසඳාගනිම්ද?

මම ෆ්ලොරන්ස් එකෙන් එලියට බැස්සේ හීනෙන් වගේ බෑග් තිබුණු අතේ .තිබුණා බරක් මහා හිතේ . .වගේ වෙලා අමතක බර බෑග් නිසා බර හිතේ දැනෙන තදින්ම දැන් දැනුනත් ගොඩක් කලින් බර දෙකේ හීන මගේ දෙයියනේ .කතාකලේ ආදරෙන් අරව්දියට ඉරු එක්කද කාත්ලෝක සේරම එකම තැන බිදිලා යාවිද? හිතාගන්න බැරි විදියට මම අසරණ වෙලා ඇයි .කරන්නේ මොකද මම අයිතිනම් කාටහරි ඉරු . .බැරිවුණේ දැනගන්න හරියටම ඒක මට

ෆ්ලොරන්ස් එකෙන් එළියට බැහැලා හීම්ට ඇල්ටො පොඩ්ඩට නැගලා බෑග්දෙක පිටිපස්සේ සීට් එකට දැම්මා. ටික වෙලාවක් සුක්කානම අත්දෙකෙන්ම අල්ලගෙන කල්පනා කලා. වාහනේ පණගන්වන්න වත් හිතක් නෑ..ඒත් හිත ඒ සිද්ධිය සාධාරණීකරණය කරලා මම සාමකාමී කරන්න හදනවා...කව්රුහරි ඉරු අඳුරන කෙනෙක් වෙන්න ඇති...ඒත් අරව්දියට කතාකරනවද කොල්ලෙක් එක්ක ඇරෙන්න..

නොදැනීම වගේ ඇස්දෙකත් රතුවෙලා. වාහනේ පණගන්වගෙන පුරුද්දට වගේ හිමින් හිමින් බෝධිය පහුකරලා ආවා. මහනාම පාලම උඩදි තදබදය අතරේ නවත්තගෙන හිටිද්දි ඇත මෝය කට පැත්තෙන් පේන දර්ශනේ දකිද්දි හිතට හරිම අසරණ කමක් දැනුනා..ඉදලා ඉදලා මම කරන්න ගත්තු ආදරණීය ආදරය ඇරඹුමම කඳුලක් වේවිද?..අනේ මංදා..ටිකක් වේගය වැඩිකරලා ගෙදර ආවා. ඇවිත් කතා නොකරම කාමරේට ගිහින් දොර වහගෙන ඇදට වැටුණා.

ඒ අතරේ ෆ්ලොරන්ස් එකෙන් පිටවුණු ඉරුදිකා ඉක්මණින්ම ගියේ ස්ටේෂන් හන්දියට. සෙන්තෝමස් එක ගාවින් පාර මාරුවෙලා අමිල ස්ටූඩියෝ එකගාවට ගියේ විදුලි වේගයෙන්..නවීන පන්නේ පල්සර්

යතුරු පැදිය නවත්තගෙන මූණත් කළුකරගෙන ඉන්න මූණ දැක්කම ඉරුදිකා ටිකක් බයවුණත් එක්ක...ඉරුදිකා එනවා දැක්ක ගමන් ඔහු යතුරු පැදියේ කණ්ණාඩියේ එල්ලුවේ අතේ තිබුණ හිස්වැසුම..ඊලගට ඔරවලා බැලුවා ඉරු දිහා..

"...මම දැන් කීයේ ඉඳන් මෙතනද...කෝල් ගන්නවා ගන්නවා ආන්සර් කරන්නෙත් නෑ..."

ඔහු කියාගෙන ගියේ වටේ පිටේ අයටත් ඇහෙන්න..ඉරු හිනාවුණේ සමාව ඉල්ලන් ප්‍රවේශයක් ගන්න

"...අනේ සොරි මගේ අයියණ්ඩියේ..වැඩ ගොඩයිනේ අද...."

අයියණ්ඩියේ? එතකොට මේ හිටියේ ඉරුගේ අයියා. එකම අයියා. ධනංජය..එතකොට සදීප ලග හිටිද්දි කතාකරෙත් අයියම තමයි. පව් සදීප බයවුණු තරමක්..

"...සොරි තමයි..යංකෝ ගෙදර මම අම්මා එක්ක බලාගන්නම්.."

යතුරු පැදියට දෙන්නම නගින ගමන් අයියා ඉරුට ආදරණීය තර්ජනයකුත් කලා..ඉරු බයික් එකට නැගලා අයියව බදාගත්තේ උතුරන සහෝදර සෙනෙහසින්..

...මගේ අයියා මට සමාව දෙනවා..මම දන්නවෝ...

...ඔව් ඔව් සමාව තමයි...මම අම්මට කියලා තමයි ගිය සතියේ ගියේ යන්න දෙන්න එපා කියලා කොහේවත්..බබා ඔයා තමයි අම්මටත් බන්නවන්නේ...

යතුරු පැදිය හක්මණ පාරේ යන ගමන් අයියා කිව්වා. ධනංජය වැඩ කරන්නේ කොළඹ පුද්ගලික ආයතනයක පරිගණක ක්‍රමලේඛන ශිල්පියෙක් විදියට. ගෙදර එන්න වෙන්නේ සතියකට සැරයක්. ඒ ආවත් ඉක්මණට ආයෙත් දුවනවා. ඉරුදිකාට තමන්ගේ එකම අයියගේ මේ කාර්යබහුල ජීවිතය හොදටම ඇතිවෙලා තිබුණේ..අදත් ගෙදර ආවේ දවල් වෙලා. එනකොටත් ඉරු නැති නිසා තමයි ටවුන් එකට ගිය ගමන් නංගිවත් දාගෙනම එන්න කතාකර ගත්තේ.

තමන්ගේ නංගි පොඩ්ඩ හුරතල් වෙලා සමාව ඉල්ලද්දි මොන අයියටද හිත තදකරගෙන ඉන්න පුළුවන්. ධනංජයත් ටිකක් කෑගහලා සමාව දුන්නා. කොහොමහරි ගෙදර යද්දි දෙන්නා හොදටම යාළුයි.

*******************************************************

පහුවෙනිදා කාර්යාලෙට ගියෙත් හිත හොඳින් නෙවෙයි. බලාගෙන හිටියේ කොයිවෙලාවේ හරි ඉරු තමන්ට කෝල් එකක් දෙයි කියලා. ඒත් හිතේ සැකයක් තිබුණා ඒ වෙලාවේ ඉරු නම්බර් එක ගත්තේ වදෙන් ගැලවෙන්න දෝ කියලා..ඒ විතරක්ද අර මුකුළු කර කර කෝල් කරපු කෙනා..ඒක මතක් වෙද්දි මගේ ඇගේ මාළු නටනවා...අපරාදේ නිකං ඕක මතක් කරලා දවස සවුත්තු නොකරගන්න හිතා ගත්තා.

තමන්ගේ කාර්යාල කාමරේ හරි හුරුබුහුටි විදියට තියාගෙන ඉන්න හරිම ආසවක් තියනවා. ඒක ජීවිතේ වැඩි කාලයක් ගෙවෙන තැන නිසා ගෙදර වගේම ආසවෙන් තියන් ඉන්න මාර දූකක් විඳිනවා. ඉතිං කාර්යාල කාමරේට ආවත් හිතේ තිබුණු පුස්කාපු ගතියනම් හරිගියේම නෑ. වෙනදට මොන ප්‍රශ්නේ තිබුණත් ඔපීස් රූම් එකට ආවම සේරම හරියනවා..ඒත් අද..

ඒ අතර සීනුව නාදවුනා දොර අසල තියන. කව්ද පාන්දර?

''..කම් ඉන්...''

''..ගුඩ් මෝර්නින් මිස්ට සදීප...''

මගේ දෙවනියා නුවන්ත..උදේම සුපුරුදු කේලාම් ටික අරගෙන ඇවිත්. දැන් ඉතිං පැයකට යන එකක් නෑ. මට ඕන වුනේ ටිකක් තනිවෙලා ඉන්න. කොහෙද..

''...සර් මම පොඩි බඩ්ඩක් ගෙස් කරන්නම්...''

නුවන්තගේ කතාවට මම විකාර වුණා..මොකාටද මේ යකා එන්න හදන්නේ.

''...හා කරමු බලන්න..''

කල්පනා කර කර හිටපු නුවන්තයා එකපාරටම දාර ගලක් අතෑරියා වගේ අතෑරියා හෙණ කේලමක්. කරුමේ කියන්නේ ඒක මම ගැනනේ.

''...සර් ලගදිම බඳිනවා...''

''..මොකා..මේ මම...තමුසෙට පයිත්තියන්ද ඕයි..මම එහෙම එකක් ගැන හිතලවත් නෑ..''

මම සේරම අප්සට් මූඩ් අමතක කරලා කිව්වා..

''...සර්ට නැතිවුනාට සර්ගේ ගෑනු ළමයට එහෙම අදහසක් ඇති..නැතිනම් සර් එක්ක ෂොපින් යාවියැ...''

මොකක්ද මේ යකා මේ කියන්නේ. මගේ ඔලුවට දැන් තමයි කාරනේ ආවේ. රොයිටර් පුවත් සේවේ මාතර විශේෂිත නියෝජිතයා වෙච්ච නුවන්තට මමයි ඉරුයි ෆ්ලොරන්ස් එකේ ඉන්නවා දර්ශනය වෙලා ඇති. ඒකනම් සහතිකයි.

''...තමුසෙ ඔය කියන්නේ ඊයේ ෆ්ලොරන්ස් එකේ හිටපු එකද?''

''..අන්න හරි සර්...අන්න නියම තැනට ආවා...සර් පාටියක් දෙනවද දැන්ම..දෙනවනම් කලින් කියන්න සර්...මම අද ෂෝට් ලීව්..නැත්නම් මට මිස් වෙයි..''

''...තමුසේ මගුලක් කතාකරනවා..ඒ මම දන්න කෙල්ලෙක්...''

“...ඔව් ඉතිං සර් අපි කව්රුවත් නොදන්න කෙල්ලෙක් කසාද බඳින්නේ නෑනේ...“

හිතේ තිබුණු දුක අස්සේ මේ යකා කියන කතාවලට හිත තවත් අවුල් වෙනවා.

“...ඒකි බඳින්න කෙනෙක් ඉන්නවා ඕයි...“

මම තරහටම කිව්වා. නුවන්තගේ මූන අඳුරුවුණා..

“...ඒකත් එහෙමද..එහෙනම් දුක තමයි...“

“..මොන දුකක්ද අයියේ...මේ බයිල නොගහ දැන් ගිහින් ඊයේ සමන්ති මිස් ඉවර කරපු ප්‍රොජෙක්ට් ෆයිල් එක ගේනවා...“

නුවන්ත හිනාවක් දාගෙන පිටවෙලා ගියා. හිතට යන්තං නිවනක් දැනුනා. ඒත් හිතේ දුක දවසෙම තිබුණා.

*****************************************************

අවුරුදු ගාණක් තිස්සේ ඇදි ඇදී යන මෙගා කතාවක් අහම්බෙන් වගේ බලලා ඇදට ගියේ නිදාගන්න නෙවෙයි. කාලෙකට පස්සේ හිතුනා පොතක් කියවන්න. හිතේ බරගතිය යන්නත් එක්ක පිටුවක් දෙකක් කියෙව්වා. යසුනරි කව්බතාගේ ලස්සන පොතක්. මම ගොඩක් ප්‍රියකරන ලේඛකයෙක්. පොතට වශීවෙලා හිටිද්දි දුරකතනය නාදවුණා.

“...හෙලෝ...“

“...හෙලෝ මේ සදීප අයියද?...“

මේ සදීප අයියද කියලා අහපු කටහඬින්ම වගේම ඒ අහපු විදියෙන්ම තීරණය කලා මේනම් ඉරුම තමයි කියලා.නිසා ඉවර ඇතුල්වෙලා වලට නහර ලේ මගේ ඉරු වෙනකොට මේ මොකද .

“...ඔව් මම සදීප තමයි කව්ද මේ?...“

නොදන්න ගාණට ඇහුවා. කෙල්ල ටිකක් ලැජ්ජාවෙන් වගේ ගොතත් ගැහුණා. අනේ ඉතින් මේ අවස්ථාව එනකං කොච්චර බලං හිටියද මම.

“...මම මේ ඉරුදිකා කියලා කෙනෙක්...අයියා මට නම්බර් එක දුන්නේ පොඩි උදව්වක් ඉල්ලලා...අර ෆ්ලොරන්ස් එකේදි...“

කෙල්ල යාං හැල්ලක් කියාගෙන ගියේ මට එයාව මතක නෑ කියලා හිතාගෙන වෙන්න ඇති. එහෙම අමතක කරන්නේ කොහොමද මගේ ජීවිතේම අරං ගියපු ඔයාව.

“...ඔච්චර විස්තර කියන්න ඕන නෑ කෙල්ලේ...මම ඔයාව අඳුනගත්තා...“

මම කියපු විදිය දයාබර වැඩිද මංදා කෙල්ල ටිකවෙලාවකට ගොලුවුණා. මට මුලින් කලබල වැඩිවුණාවත්ද කියලා හිතුණට පස්සේ හිතුනා කමක් නෑ ඒක තමයි කෙල්ලට මං ආදරෙයි කියලා අඟවන්න ගත්තු පලවෙනි ප්‍රවේශය කියලා. නිහඬතාවය මගඇරලා ඉරු කතාකරා.

“...අයියේ මම කතාකලේ අර අයියා කියපු පණිවිඩේට..“

“..ඔව් නංගා කියන්න...“

නංගා කියපු පාර කෙල්ල ආයෙත් ගොළුවුනා. මගේ කටත් ඉතිං අයියෝ සීමාවක් නෑනේ.

“...අයියා අපේ පැත්තේ නංගි කෙනෙක් ඉන්නවා..එයා ඒ ලෙවල් කරලා ගෙදර ඉන්නේ...ගවර්මන්ට එකෙන් කරන කම්පියුටර් කෝස් එකකුත් කරලා තියනවා..එයාව හරියයිද අයියා..“

කෙල්ල මගේ වැඩේ ගැන කොච්චරනම් උනන්දුද කියලා මට තේරුණා. ඇත්තටම මම හිතුවටත් වැඩිය කෙල්ල මේ වැඩේට මහන්සිවෙලා තියනවා.

“..හරියයි වගේ නංගි..මම මගේ යාළුවට කියන්නම්...අනේ ගොඩක් පින් නංගා ඔයාට...ඒ උදව්වට..“

“...මට නෙවෙයි පින් දෙන්න ඕන අයියා..ඒ කෙල්ලට රස්සාවක් දෙන අයියටයි අයියගේ යාළුවටයි...ඒ කෙල්ල ගොඩක් දුප්පත් පවුලක කෙල්ලෙක්..තාත්තා ගහෙන් වැටිලා එකතැන..අම්මයි ඒ නංගියි ජීවත්වෙන්නේ බත්පැකට් හදලා..ලොකු පිනක් අයියා..අපේ ගෙවල් ලගමයි..අපිත් පුළුවන් විදියට උදව් කරනවා..මේක කරන්න පුළුවන් නම් මහමෙරක් වගේ වෙයි ඒ නංගිට...“

ඉරු කියාගෙන ගියපු වචන ටික මම අහන් හිටියේ හීනෙන් වගේ. කොච්චර සංවේදී කෙල්ලෙක්ද. සමහර කෙල්ලෝ තමන්ගෙම කෙල්ලෝ තඹ සතේකට ගණන් ගන්නේ නැති කාලේ ඇත්තටම ඉරු අදහන්න වටින කෙල්ලෙක්. ඉරු මගේ හිතේ හිටපු හීන කුමරිගේ ලක්ෂණ එක එක පෙන්නනවා කියලා දැනුනම හිතගොඩක් ප්‍රීතිමත් වුණා.

“..හොඳයි නංගා…අපි කොහොම හරි ඒක කරමු…එයාට කියන්න මට කෝල් එකක් දෙන්න කියලා…මම නිසල්ට එයාව කන්ටැක් කරන්නම්…“

අපි කරමු..කියන වචන ටික ඇහුණම කෙල්ලට හිනාවකුත් ගියා.

“…ගොඩක් ස්තුතියි අයියේ..එහෙනම් මම තියන්නම්…“

හිත කඩාගෙන වැටුණා…අනේ අනේ..තව චුට්ටක් ඉන්න කියලා කියන්න හිතුණා. ඒත් සංවර වුණේ නැත්නම් දෙවනි අවස්ථාව නැතිවෙයි කියන බයට කටවහගෙන හිටියා.

“…හොඳයි නංගා…මේ ඔයාගේ නම්බර් එකද?..මම මේක සේව් කරගන්නද?“

මම අහපු විදියට කෙල්ල නිරුත්තර වුණා. ඒත් මගේ ලෙංගතුකම ඉස්සරහි කෙල්ලට පිටුපාන්න බැරිවුණා.

“…හා කමක් නෑ අයියා…බුදු සරණයි“

තියන්න කලින් හිත පාරවගෙන තිබුණු ප්‍රශ්නෙ ඇහුණේ ඉබේටම වගේ

“..නංගා එදා කොහේද ෆ්ලොරන්ස් එකේ ඉඳලා හදිස්සියෙම දිව්වේ…කව්රුවත් තර්ජනයක්වත් කලාද?“

මම විහිලුවට වගේ හිතේ තිබුණු ප්‍රශ්නෙ ඇහුවා. කෙල්ලට ලස්සන හිනාවක් ගියා.

“..ඒකත් එක්තරා තර්ජනයක් තමයි අයියේ..එදා මම අපේ අයියට එනවා කියලා මග ඉන්න කිව්වා..එයා පරක්කුවෙලා නිසා කෝල් කලේ…“

පපුවේ ඇණිලා තිබුණු ගල් ඉන්නක් අයින්වුණා වගේ හිතට මහා නිදහසක් දැනුනා. එහෙනම් ඒ ඉරුගේ කොල්ලා නෙවෙයි අයියා. කව්ද දන්නේ ඕක. මම අපරාදෙ බය වුනේ. එහෙනම් ඉරු තාමත් අවේලබල්..

“..බුදු සරණයි නංගි...“

ටිකකින් දුරකතනය විසන්ධි වුණා. මම ඉරුගේ අංකේ තැන්පත් කරගත්තා. දුරකතනේ වගේම හදවතේ

****************************************************

ඉරු කියපු විදියටම අර කියපු නංගි මට කෝල් කලා. එයා දුල්මිණි. හරි අහිංසක කෙල්ලෙක්. තුඩාවේ මිනිස්සු හරි වසයි කිව්වට ඉරුත් හොදයි දුල්මිණිත් හොදයිනේ..ඒක තමයි ඔය පොදුවේ කියන කතා කොච්චර බොරුද කියලා තේරෙන්නේ දැන් තමයි. මාතර මිනිස්සුන්ගේ ගුණාංග පොදු කෝණෙකින් මනින්න බැරිවුණාට එකට ජීවත්වෙද්දි ඒ ගුණාංග හොදින් අදුනගන්න පුළුවන්.

තවත් ඒ විදියෙම උදාර ගුණයක් ප්‍රදර්ශනය කරමින් කිසිදු සම්මුඛ පරීක්ෂණයක් වගක් විභාගයකින් තොරව දුල්මිණි තමන්ගේ කම්නියුකේෂන් එකේ වැඩට ගන්න නිසල් තීරණය කලා. ඒ මගේ ඉල්ලීම නිසාම විතරක් නෙවෙයි මිනිහට දුල්මිණි ගැන කිව්වම ඇත්තටම හිත උණුවෙලා. දික්වැල්ලෙ කොල්ලන්ට හිතක් තියනවා කියලා දැනගත්තෙත් එදාම තමයි මම.

කොහොමහරි දවසක් අපි දෙන්නා දෙවුන්දර දේවාලේ ඉස්සරහා ඉදිවෙන නිසල්ගේ කම්නියුකේෂන් එක බලන්න ගියා. වැඩ ඉවරවෙන්නත් ලගයි. තමන් ඉහල මට්ටමේ රැකියාවක් කලත් තවත් ආදායම් මාර්ගයක් විදියට මෙහෙම දෙයක් කරන්න යන එක හොද ආදර්ශයක්. අපි දෙන්නම පන්සලටයි දේවාලෙටයි ගිහිල්ලා පඩුරු දැම්මා.

“...බුදුන්ගේ සරණින්...දෙයියන්ගේ පිහිටෙන් උඹේ වැඩේ හරියන්න ඕන බං කියලා..මම පඩුරක් දානවා නිසල් කට ඇරන් බලන් හිටයා. “

බලං ඉදලා නිකං හිටියේ නෑ මිනිහත් ගත්ත පඩුරක්.

“...බුදුන්ගේ සරණින් ...දෙයියන්ගේ පිහිටෙන් තොගේ වැඩෙත් හරියන්න ඕන“

කියලා පඩුර දැම්මා. මම කල්පනා කලා මොකක්ද මගේ වැඩේ කියලා.

“...මොකක්ද හරකෝ මගේ වැඩේ?...“

“..ඇයි උඹේ  අර තුඩාවේ කුමාරි...හීන අප්සරාවි..අර ඉරුද සඳුද? කව්ද...අන්න එයාගේ හිත මෙව්වා වෙන්න කියලා පඩුර දැම්මේ.“

නිසල් බදාගෙන ඉබින්න හිතුනා. මමත් ඒ දේ ගැන පුදබිමට ආපු වෙලාවේ ඉඳලා කල්පනා කලා.

“...ඔව් බන් ඒකත් මගේ හිතේ තියන ලොකු ප්‍රාර්ථනාවක්. ඒකි මට හැම අතින්ම ගැලපෙනවා..මගේ හිත මල් ආසනයක් වගේ තියන් හිටියේ ඒ මල පූජකරන්නමද කියලා මට හිතෙනවා බං...“

හිතේ තිබුණු අවංක හැගීම මම කිව්වා.

“...මම ඒකි නොදැක්කට උඹ කියන දේවල් වලින් ඒකි ඇත්තටම හොඳයි කියලා මටත් තේරෙනවා බං..Keep doing මචං...ඕන දේකට මම ඉන්නවා..“

මම නිසල්ගේ කරටත් අතදාගෙන දේවාලේ පුදබිමෙන් එලියට ආවා. හිතට ලොකු සැහැල්ලුවක් දැනුනා.

*****************************************************

ඉරිදා උදේ ටිකක් පහුවෙලා ඇහැරුණේ. ඇහැරෙනකොටම සාලෙ පැත්තෙන් ආවේ ලස්සන ගීතරාවයක්. අක්කා පුටු පෙරලා පෙරලා ගේ අතුගානෙ සද්දේ අතරින් ගීතරාවේ කාමරේටත් ඇතුල් වුණා.

රත්තරන් නෙත් දෙකෙන්
සලා සිහිල් පවන්
ජීවිතේ ලසෝ තැවුල්
නිවන්න රත්තරන්....
ටී.එම් ගේ සින්දුව කොච්චර මගේ හිතට බලපෑමක් කරනවද මේ ටිකේ. ඉරුදිකා ඇවිත් මගේ ජීවිතය ගීතයක් කරන්නයි හදන්නේ. ඇත්තටම ඒක මට ලොකු වෙනසක්. ඒකාකාරී ජීවිතේට ඉරු එක්කරපු සුන්දරත්වය මට දරාගන්නත් අමාරු තරම්.

ඉරු ඔයාගේ ඇස්දෙකෙන් මගේ හිතේ තියන ලසෝ තැවුල් එක තත්පරේකින් නිවලා දාන්න පුළුවන් සත්තයි. මම දන්නවා ඒක. මගේ හිත සාක්කි ඒකට. මම නොදැනීම ඔයාට ගොඩක් ආදරේ වෙලා ඉරු.

‘‘...චූටි මල්ලී...තේ හදලා...‘‘

එකම මල්ලිට චූටි මල්ලි කියලා අපේ අක්කා කියන්නේ හරි ගොඩක් ඉන්නවා වගේනේ. කොහොම හරි දැන් ඇඳේ හිටියා ඇති කියලා හිතුන නිසා නැගිටලා ජංගම දුරකතනේ අතට ගත්තා..

ඉබේම වගේ සම්බන්ධතා ලයිස්තුවේ ඉරුගේ අංකය ලග නතර වුනේ අහම්බෙන් වගේ. මගේ දැගලිලිකාර හිතට හිතුනා ඉරුට කෙටි පණිවුඩයක් යවන්න..

‘‘..ගුඩ් මොර්නින් නංගි..ඔයාට සුබ දවසක්...බුදු සරණයි...‘‘

පණිවුඩේ යැව්වා. වාර්තාව ආවා ගියපු බව ඉරුගේ ලගටම. මටත් යන්න පුළුවන් නම් එයා ලගට මොහොතකට හරි.

අක්කාගේ දෙවන විධානේ එන්න කලින් ගිහිං තේක ගත්තා. අම්මා හිනාවේගෙන ලගට ආවා.

‘‘...චූටි පුතා..මොකද මේ හෝන්දු මාන්දු වෙලා වගේ..ලෙඩක් වත්ද..‘‘

අම්මා ඇහුවා...හ්ම්ම් මට තියන එකම ලෙඩේ දන්නේ මමම තමයි. ඒක හොදකරන්න පුළුවන් දොස්තර කෙනෙක්ට නෙවෙයි එකම එක සුන්දර කෙල්ලෙක්ට.

ඉරිදා දවසේ අම්මා එක්ක ටිකක් කුස්සියට වෙලා කතාකර කර ඉන්න හිතුණා. අම්මා උදේට උයන අතර තුරේ සතුටු සාමිචියේ යෙදුනේ සතියේ නිවාඩු දවසෙ ගෙදර ඉන්න එකේ සතුට බෙදාගන්න වගේ.

ටික වෙලාවකින් කාමරේ පැත්තට ගියේ නාන්න යන්න කියලා හිතාගෙන. දුරකතනෙට අත ගියේ නිකම්ම. අලුත් කෙටි පණිවුඩයක්..

‘‘...ගුඩ් මෝර්නින් අයියා..ඔයාටත් සුබ දවසක්....බුදු සරණයි..‘‘

රත්තරන් පාට වෙලා පෙනුන අකුරුවලට උඩින් ඉරුගේ නම් තිබුණා. ෆෝන් එක පපුවට තුරුල් කරන් මම එහෙම්ම ඇදට වැටුණා...

ජංගම දුරකතනය අතට වගේම හිතටත් එච්චරටම ලංවුණු කාලයක් තිබුණේ නැති තරම්. ජංගම දුරකතනේ මිලට ගත්තු මුල්ම දවස්වලවත් මම එච්චරටම ඒකට ආසාවෙන්නේ නැතුව ඇති දැන් තරම්. ඉරු ගේ කෙටි පණිවුඩයක් කියවන වාරයක් වාරයක් ගාණේ කියාගන්න බැරි ආදරයක් හිතේ දගලනවා.

තත්තපරයක් තත්පරයක් ගානේ ඉරු හිත මගෙන් උදුරගනිද්දි මම හරි අසරණ විදියට තනියම බලන් ඉන්නවා. ඒත් ඒක වැඩි කාලෙකට නෙවෙයි.
හැමදෙයක් අතරින් කාලයත් ඔහේ ඉදිරියට යනවා. නිසල්ගේ කම්නියුකේෂන් එක විවෘත කරන දිනෙත් ලග ලග එනවා. දුල්මිණි නංගිත් නිසල් එක්ක හරි හරියට මහන්සිවෙලා ඒකේ වැඩ. මටත් පුළු පුළුවන් විදියට ඒකට උදව් කලා. දවසක් මමයි නිසලුයි එකට ඉන්න වෙලාවක මම නිසල්ගෙන් දෙයක් ඇහුවා.

‘‘...මචං මම කඩේ ඕපනින්ග් එක ඉරුදිකාට කියන්නද?..‘‘ .

‘‘...අදහසනම් සිරා මචං...හැබැයි තුඩාවේ කුමාරි උපුල්වන් පුරේට වැඩම කරයිද?....‘‘

‘‘...ඒකත් ඇත්ත..ඒත් මම කියලා බලන්නම්..දුල්මිණිත් ඉන්න නිසා කෙල්ල ඒවි...‘‘

‘‘...එහෙම වෙනවනම් රත්තරං බං..එතකොට ඒ වැඩෙත් දෙවුන්දරදිම පූට්ටු වෙයිනේ...‘‘

‘‘...පූට්ටු වෙන්න තෝ හිතුවද අපි වයරින් කරන්න යනවා කියලා...‘‘

‘‘...නෑ වයරින් නොකරට උඹ මේ ටිකේ ඉන්නෙනම් එහෙමයි.....‘‘

සුහද මිතුරු විහිලු තහලු මැද මට හිතුනු දේ මම නිසල්ට කිව්වා. ඇත්තටම ඉරු එදාට ආවොත් මට තවත් ලං වෙන්න පුළුවන් වෙයි. ඉරු ඒවිද එදාට.

****************************************************

උදේම නැගිටපු ඉරුදිකා ගේ දොර අස්පස් කරලා ටිකක් වාඩිවෙලා හිටියා. ඇගට හරිම මහන්සියි. ඒත් තව වැඩ ටිකක් තියනවා. ඉරුදිකා හරි ආසයි ගෙදර පිලිවලට තියාගන්න. අම්ම කොතරම් ඒකට එක එක ඒවා කලත් ඉරු කැමතියි ඒ හැමදේම තමන්ගේ අතින්ම කරන්න.

ඉරුගේ තාත්තා නැතිවුණත් හැමදේම පුළුවන් විදියට කරන්න ලැබුණේ අම්මගෙයි අයියගෙයි හයිය නිසයි.පවුලේ බර කරට ගත්තේ අම්මයි අයියයි ඉරුට කිසිම අඩුවක් කලේ නෑ. අම්මා පුළුවන් හැම විදියටම මහන්සිවෙලා පවුලේ බර තමන්ගේ කරට ගත්තා. අයියට රැකියාවක් ලැබුණම ගොඩක් ඒ බර හැල්ලු වුනා. ධනංජය අයියා තමන්ගේ පවුලට දෙන මහා හයිය නිසා ඉරු ගොඩක්ම අයියට ආදරේ කලා. තමන්ගේ කිසිම දෙයක් ගැන නොහිත ඔහු පවුලේ දේවල් කලා..

ඉරු විඩාව පැත්තකින් තියලා ආයෙත් අස්පස් කරන වැඩ පටන් ගත්තා. එතකොටම ජංගම දුරකතනය නාදවුනා. ඉරු බැලුවා අංකය...සදීප..කෙටි පණිවුඩ එවනව මිසක් නිතර කතානොකරන නිසා ඇය පුදුමෙන් වගේ දුරකතනයට ප්‍රතිචාර දැක්වුවා.

"...හෙලෝ..."

"...හෙලෝ නංගා..මම සදීප අයියා..බිසී ද?..."

"..නෑ අයියා කියන්න..හදිස්සියක්වත්ද?..."

"..හදිස්සියක්නම් ගිනිනිවන බලකායට හරි පොලීසියට හරි කියනවනේ...ඔයාට කියන්නේ නෑනේ..."

සදිපගේ කතාවට ඉරුට හිනා ගියා. සදීප දැනගත්තා දැන් ඉරුගේ මූඩ් එක හරි කියලා..

"...නංගා පොඩි ආරාධනාවක් කරන්න කතා කලේ..."

"...මොකක්ද අයියා?..."

"..එනවද කියන්න කෝ..."

"...ඉතිං ආරාධනාව කියන්නේ නැතුව එහෙම කියන්න පුළුවන්ද..."

“...අම්මපා ඇත්තනේ...මගේ පුංචි මොලේට ඕක මතක් වුනේ නෑ...“

ආයෙත් කෙල්ලට හිකිස් ගාලා හිනා ගියා. මේ අයියා නම් පිස්සු කෝච්චියක් ඉරුට හිතුනා.

“...නංගා අර දුල්මිණි නංගි වැඩට ගත්තේ...මගේ යාළුවා නිසල්ගේ කමිනියුකේෂන් එක 25 වෙනිදා පටන් ගන්නවා..ඉතිං ඔයාටත් ආරාධනා කරන්න කියලා නිසල් කිව්වා...“

ඉරුට මොනවා කියන්නද කියා හිතාගන්නට බැරිවිය.

“...මම මොනාටද අයියා එතනට....“

“...ඇයි ඔයා කොච්චර උදව්වක්ද කලේ..වැඩ කරන්න හොද ගුණ යහපත් නංගියෙක් හොයලා දුන්නා.ඒක නිසා එදාට ඇවිත් කිරිබත් කෑල්ලක් කාලා යන්න...හැබැයි තෑගිනම් උස්සන් එන්න එපා හොදේ...“

ඉරු කල්පනා කලා කඩේ දාන්නේ කවුරුවත්, තමන්ට ආරාධනා කරන්නේ තවත් කවුරුවත්.ඒ මදිවට ගෙන්න ගන්නම හදනවා..මල සමයං...

“....එනවනේද?...“

නිහඩතාවය නිසා සදීප ඇහුවා.

“...බලමු...“

සදීප දැනගත්තා කෙල්ල එනවා කියලා. ඉතිං විස්තර ටික කියලා සදීප ඉක්මණට කට් කලේ කෙල්ල බෑ කියයි කියන බයට.

************************************************

හා හා පුරා කියලා තමන්ගේම ව්‍යාපාරයක් පටන් ගන්න මොහොතේ නිසල්ගේ මූණේ අපූරු හිනාවක් තිබුණා. මගේ මූණෙත් ලස්සන හිනාවක් තිබුණා..ඔව් ඉරු එයි කියන සතුටට.

කඩේ ඕපන් එකට හිටියේ මමයි,දුල්මිණි නංගියි, නිසලුයි එයාගේ පවුලේ කට්ටියයි විතරයි. බොහොම චාමෙට කටයුතු සූදානම් කලා. මමයි නිසලුයි පාන්දරින්ම පන්සලට ගිහින් ඒ ගමන් දේවාලෙටත් ගිහින් ආවා. පන්සලින් ගෙනාපු පිරිත් පැන් ටිකක් එහෙම ඉහලා වැඩේ පටන් ගත්තා.

“....සේරම හරි නේද මචං...“

නිසල් හැමදේම අහන්නේ මගෙන්. මම වැඩ රාජකාරි හැම එකක්ම අස්සේ ඉරුගේ පැමිණීම බලන් හිටියා.

නැකත් වෙලාවට කිරි උතුරවලා සංජීව කම්නියුකේෂන් එක පටන් ගත්තා. හැමදෙනාගෙම මූණුවල ලස්සන හිනාවක් තිබුණා. කට්ටියම කිරිබත් රසකැවිලි රස විදලා සතුටු වුණා. මම පාර පැත්ත බලාගෙනම හිටියේ ඉරු එයි කියලා. ටිකක් පරක්කු වෙනකොට හිත බය වුනා.

එයා එන එකක් නැද්ද? එහෙම් හිතනකොටම ඒ හිතේ ඇඳුනු ලස්සනම් රූපේ දෙවුන්දර ප්‍රාදේශිය සභාව ඉස්සරහ හෝල්ට් එක ගාවින් මතුවුනා. බොහොම චාම් තැනට ගැලපෙන සරල ඇඳුමක් ඇදගෙන. අතින් කොණ්ඩ කැරළි හද හද එන ඉරු දැක්කම හිතේ තිබුණු ආදරේ හිතින් පැනලා දුවලා ගිහින් ඉරුව බදාගත්තා.

මම නිසල්ට කතා කරලා කෙල්ල පෙන්නුවා.

“..මේ උඹේ තුඩාවේ කුමාරිද?...ෂා පිස්සු පීකුදුනේ...අනේ මචං සිරාමයි...මගේ උණුසුම් සුභ පැතුම් උඹට...“

නිසල් කියවගෙන යද්දි ඉරු කඩවල බෝඩ් ලෑලි බල බල නියම තැනට ආවා. මම කඩෙන් එලියට ගිහින් ඉරු පිළිගත්තා. මම දැක්කා විතරයි කෙල්ලගේ මූණේ අමුතු ලැජ්ජාවක් මතුවුනා..ඒත් කෙල්ලගේ මූණ ලෙඩපාටයි..ඇදිලා ගිහින් වගේ...ගමන් මහන්සියට වෙන්න ඇති.

“....එහෙනම් ඔයා ආවා නේද?...තැන්ක්ස් හොදේ...“

‘‘...මම ආවේ අලුත් කමිනියුකේෂන් එකට....‘‘

කෙල්ල එහෙම්ම ඇතුලට යද්දි නිසල් පිලිගත්තා. පස්සේ දුල්මිණි ඇවිත් ඉරූ එක්ක එකතුවුනා. මුලින් කසු කුසුවක් ගියා මේ කව්ද මේ දැරිවි කියලා. පස්සේ නිසල් ඒක ෂේප් කලා.

තමන්ගේ තැනක් වගේ බොහොම ආසාවෙන් කිරිබත් කාලා ඉරූ තමන්ගේ සුභ පැතුම් අලුත් ව්‍යාපාරෙට පුදකලා. ගොඩක් වෙලා එහෙම ඉන්න ආසවුනත් කාලය ටිකෙන් ටික පියාඹලා ගියා.

යන්න හදද්දි ඉරූ නිසල් ලගට ගිහින් පුංචියට ලස්සනට නවපු ලියුම් කවරයක් නිසල්ගේ අතේ තිබ්බා.

‘‘...අනේ පිස්සුද නංගි..මේ මොනවද,?...‘‘

‘‘...සුළු තෑග්ගක් අයියා..ගත්තේ නැත්නම් මම තරහයි...‘‘

නිසල් බෑ කියමින් ප්‍රතික්ෂේප කරද්දි හැමෝම හිනාවෙමින් හිටියා. පස්සේ ඉතින් කෙල්ල මගේ මූණ බල බල නිසල්ට බල කරද්දි මම නිසල්ට කිව්වා ගනින් කියලා.

ඉරූ සතුටින් දීපු දේ නිසල් බාරගත්තා. ඉරූදිකා හැමෝගෙන්ම සමු අරන් ගෙදර යන්න හදද්දි හැමෝගෙම හිත් කෙල්ල දිනාගෙන තිබුණා. අන්තිමට ආවේ මගේ ලගට.

‘‘...මම යන්නම් අයියා...‘‘

‘‘...ඉන්න මාත් දැන් ටවුන් යනවා...‘‘

‘‘...අනේ නෑ අයියා මම බස් එකේ යන්නම්...‘‘

මට ටිකක් තරහත් ගියා. ඒ මොකුත් නිසා නෙවෙයි මේ රත්තරන් අවස්තාව අහිමිවෙයි කියලා.

"...කිව්ව නේද මාත් එක්ක යං කියලා...මම ටවුන් එකෙන් බස්සනවා..වෙන කොහේවත් එක්ක යන්නේ නෑ..."

මම කියපු විදියට කෙල්ල මෙල්ල වුනා. අහිංසක මූණ බයවෙලා වගේ මගේ දිහා බලද්දි හිතට මහා දුකක් දැනුනා. මම කට්ටියටම කියලා වාහනේ ලගට යද්දි නිසලයා ඇවිත් පිටට තට්ටු කරලා ගුඩ් ලක් කිව්වා.

හෙමි හෙමින් ආපු ඉරුත් වාහනේට නැග්ගේ බයෙන් වගේ. ඉරු නැග්ග විතරයි ඇල්ටෝ පොඩ්ඩ පිරිලා ඉතිරිලා ගියා වගේ සතුටක් දැනුනා. වාහනේ ස්ටාට් කලේ ඒ හැගුම මැද්දෙන්මයි..

වාහනය පදවමින් සිටියත් නෙතත් හිතත් රැදුනේ රුවැති ඇය ලගමයි. වෙලාවකට බයත් හිතෙනවා වාහනේ කොහේ ගිහින් නවතියිද කියලා. කතරගම කොළඹ පාර නිසා වැල්ලමඩම හරියේ මුහුද තීරය ලගින් යන ප්‍රධාන පාරේ වාහන ගොඩක් එහෙ මෙහේ යනවා. වාහනේ සුක්කානම මත රැදුනු අත දහස් වාරයක් ඒ සුදු අත්දෙක අල්ලගන්න හැදුවා..ඒත් හිත ඒකට ඉඩදුන්නෙම නෑ. මම කෑ ගහපු නිසා බයවෙලා ඉන්න කෙල්ල තවත් බයවෙයි එහෙම කලානම්. ඉරු ඉස්සරහ බලාගෙන වාඩිවෙලා හිටියා. හොරෙන්වත් මම දිහා බැලුවේ නෑ.මම විතරයි හොරාටවත් එයා දිහා බලන්නේ. රස්සන්දෙණිය අම්බලම ඉස්සරහින් යද්දි නිකමට වගේ කාර්එකේ ගුවන් විදුලිය ක්‍රියාත්මක කලා...

මේ නිහඩබව බිදින්න
තව මොනවහරි කියන්න
ඔය නෙත්අගින් සිනාසී
මා දිහා දැන් බලන්න...

වෙලාවට ගැලපෙනම සින්දුව යද්දි මටත් ඉරුටත් එකපාරටම දෙන්නගෙම මූණු බැලුනා..එකපාරටම ලස්සන හිනාවක් ගියා ඒ මූණේ..මටත් ඒත් එක්කම හිනාවක් ගියේ හිතේ තිබුණු දුක් දොම්නස් සේරම එක්කයි..ඒ වෙනකොට අපි හිටියේ රුහුණු කැම්පස් එක ඉස්සරහා. හවස දේශන ඉවරවෙලා කඩිමුඩියේ තමන්ගේ බෝඩිං වලට තනියම යන ළමයි සහ කිසිම කලබලයක් නැතුව අත් අල්ලගෙන කතාබහේ යන යුවලවල් අතරින් අපි හිමින් සීරුවේ ආවා.

ඉරුගේ මූණේ හීන් හීනාවක් නිතරම ඇදිලා තියෙන්නේ ඇයි කියලා මට හැමවෙලේම හිතුනා. පින් පාටට ඒ හිනාව හරියට පීක්වැල්ලෙ වෙසක් තොරණට ලයිට් දැම්මා වගේ.

"....නංගි කම්මැලි නැද්ද ගෙදරට වෙලා ඉන්න....."

කෙල්ල පුදුම වෙලා වගේ මගේ දිහා බැලුවේ අහපු ප්‍රශ්නෙ නිසා වෙන්න ඇති. කෙල්ල දන්නෙ නෑනෙ මට අහන්න දෙයක් නැති කමට සහ අහන්න ඕන දේ අහන්න බැරිකමට අහන ප්‍රශ්න කියලා.

‘‘...නෑ අයියේ ..එහෙම නෑ..ගෙදර වැඩ කරනවනේ...‘‘

කෙල්ල බේරෙන්න සිම්පල් උත්තරයක් දුන්නා. මටත් ඒවිදියට සිම්පල් ක්‍රමයකට ජීවිතය ගැන දකින්න කියලා දෙන්න කියලා කියන්න මට හිතුනා.

‘‘....ඒකත් ඇත්ත...‘‘

එළියකන්ද හන්දියෙන් කෙලින් පාරේ අපේ ගෙදර ඉස්සරහින් මාතරට යන්න පුළුවන් වුනාට මම හැමදාමත් බ්‍රවුන්ස් හිල් කන්ද මැදින් වැටුණු පාරට හරි ආසකලා. ඒ හරියෙන් මම යද්දි නිකන් මාතර නෙවෙයි වගේ මට දැනෙන්නේ ඇයි කියලා තේරෙන්නේ නෑ. ඉරු මාත් එක්ක ඉන්න සොඳුරු නිමේෂෙත් මට ඒ පැත්තෙන්ම යන්න හිතුනා.

‘‘...ලස්සනයි නේද නංගි මේ හරිය....‘‘

පර්ල් ක්ලිප් හෝටලේ ඉස්සරහින් කන්ද නගිද්දි මම ඉරුදිකාගෙන් ඇහුවා. එයත් සුන්දර විදියට පහුවෙන හැමදේ දිහාම බැලුවා.

‘‘...ඔව් අයියේ...කාලෙකින් මමත් මේ පැත්තට ආවේ....‘‘

හරි සමානකමක් හැමදාම දැනුනු විදියට අදත් මට දැනෙනවා. ඒ හැමදේම තව තවත් මාව ඉරුට ලංකලා. සුන්දර මාතර මුහුදු තීරය දිගේ මාතර පැත්තට එද්දි මට හිතුණා ඉරුත් එක්ක මෙතනට කවදාහරි එන්න ඕන කියලා.

‘‘...නංගි මම දෙයක් කියන්නම් කලබල වෙන්න එපා...‘‘

එපා කිව්ව ගමන් කලබල වුනේ නැත්නම් ඒක ගෑණු ළමයින්ගේ ගතියට කරන අපහාසයක් නිසාද මන්දා පුරුදු විදියටම එහෙම කියපු ගමන් ඉරුදිකාත් කලබල වුනා..මූණත් රතුවෙලා දාඩියත් දැම්මා...

‘‘...මොකක්ද අයියේ?...‘‘

‘‘...ඔය ඉතිං එපා කිව්ව ගමන් කලබල වුණා. මම මේ ඔයාගෙන් ණයක් ඉල්ලන්න හදනවා නෙවෙයි නංගෝ....‘‘

මම නංගා කියලා කියන හැමවෙලේම ඉරුගේ ඇස් දිලිසෙනවා. මගේ මේ හුරතල් කටේ වටිනාකම දැන් තමයි හොඳටම තේරෙන්නේ.

‘‘....කියන්න අයියා...කලබල වුනේ නෑ...‘‘

‘‘...හා එහෙනම් කමක් නෑ...මම කියන්න හැදුවේ මට පුළුවන්ද වෙලාවක නංගා එක්ක ටිකක් නිව්හැනහිල්ලේ කතා කරන්න...‘‘

ඒ පාරනම් කෙල්ල ඇත්තටම කලබල වුණා. දෙන්න උත්තරයක් හිතාගන්න බැරුව කෙල්ල ලතවුනා. මටත් ඒක තේරුනා. මම ආයෙත් ඒක ඇහුවේ නෑ. කෙල්ල ඇඟිල්ල කටේ ගහගෙන කල්පනා කලා..වෙලාවකට පව්කියලා හිතෙනවා කෙල්ල ගැන.

ටිකකින් මාතර ලංවෙද්දි ඉරු බහින්න ලෑස්ති වුණා. මම හිතුවේ එයාත් එක්ක ගෙදර ලගටම යන්න.

"...ඉන්න නංගි මම තුඩාවෙන් දාන්නම් ඔයාව...."

"...නෑ අයියා මට පොඩි වැඩක් කරගන්නත් තියනවා...මාව ස්ටෑන්ඩ් එක ලගින් දාන්න..."

මට කියන්න දෙයක් තිබුණේ නෑ. ඒක නිසා කධිර කැෆේ එක ඉස්සරහින් නැවැත්තුවා. කෙල්ල දොර ඇරලා බැස්සා

"...ගොඩක් ස්තුතියි අයියා...මම යන්නම්."

"...ඔයාටත් ස්තුතියි ආවට..."

"...ඒකට අයියා නෙවෙයිනේ ස්තූති කරන්න ඕන..."

"...ඒකත් ඇත්ත...කමක් නෑ කොහොමහරි"

කෙල්ල යන්න යද්දි මට එකපාරටම අහපු දේ මතක් වුනේ...වාහනේ හිමින් හිමින් කෙල්ල ලගින් පදවගෙන ගියා.

"....නංගි මම අර අහපු ප්‍රශ්නෙට උත්තරේ කෝ..."

කෙල්ල මාර විදියට හිරවුණා. මගේ දිහා බැලුවේ හරි අසරණ විදියට.

"...හරි හරි මම යන්නම්..බුදු සරණයි..."

නෝක්කාඩුවට වගේ කියාගෙන මාත් වාහනේ එස්.කේ එක ගාවින් හරවගෙන ගියා. කෙල්ල බෑ කිව්වවත් නම් පුළුවන් කියන තැනට හදාගන්න තිබුණා ඒත් මොකුත් නොකියම ගිය එක මාර ප්‍රශ්නයක්..එතකොටම රේඩියෝ එකේ තවත් ස්ථානෝචිත ගීතයක්..

ඇය යන්න ගියා මැකිලා
වන පියසක තුරු සෙවණැලි අතරින්..

තරහටම වගේ මම රේඩියෝ එකත් ක්‍රියා විරහිත කරලා දැම්මා

*******************************************************

ටික දවසක් වැඩ රාජකාරි අස්සෙන්ම ගෙවිලා ගියා. ඉරු මතක් නොවුණු වෙලාවක් නෑ. කෙටි පණිවුඩ හුවමාරු වුනාට වඩා වැඩිදෙයක් හුවමාරු වුනේ නෑ. ඉරු හමුවෙන්නම ඕන කියලා හිතට දැනිලා තිබුණේ.

දවසක් කෝල් එකක් ගත්තේ ඉරුට කටහඬ අහන්නම ඕන කියලා දැනුනු නිසා.

‘‘...හෙලෝ නංගා මොකද කරන්නේ....‘‘

‘‘...ඇයි අයියා හදිස්සියක්ද?...‘‘

පුරුදු විදියම තමයි ඉතිං මෙයානම් හදන්න බෑ. මට හිතුනේ එහෙමයි.

‘‘...අනේ නංගියේ මම දවසක් කීයක් නම් කිව්වද හදිස්සියක්නම් කතාකරන තැන් ලිස්ට් එක...අදත් කියන්නද...මාතර පොලීසිය.හොස්පිට්ල් එක..ගිනි නිවන හමුදාව...රතුකුරුසය..සාන්ත ජෝන් ගිලන් රථ....‘‘

‘‘...අපෝ ඇති ඇති ලිස්ට් එක...නෑ මම හිතුවේ හදිස්සියෙම කෝල් කරපු නිසා....‘‘

කෙල්ල හිනාව තද කරගෙන කිව්වා.

‘‘... හදිස්සියකට නෙවෙයි දරුවෝ ඔයාගේ කටහඬ අහන්න ඕනම කියලා කෙනෙක් කිව්වා...‘‘

කෙල්ලගේ කටහඬ නැවතුනා.

‘‘...කව්ද ඒ?....‘‘

‘‘...මගේ දඟකාර හිත...‘‘

ආයෙත් කෙල්ල නිහඬවුනා. මොනවහරි කියලා බැන්නනම් ඒත් සතුටුයි ඒත් මේ නිහඬබවනම් දරාගන්න හරිම අමාරුයි..

‘‘...නංගා මම කිව්ව එකට හා ද? බෑ ද?...‘‘

‘‘...මොකකටද අයියා...‘‘

‘‘...මම කිව්වේ මීට් වෙන්න ඕන කියලා...‘‘

ආයෙත් කෙල්ල නිහඬවුනා. ඒත් මගේ හදගැස්මනම් නතර වුනේ නෑ.

‘‘...මම ඔයාට බලකරන්නේ නෑ නංගා...‘‘

නිහඬව හිටපු ඉරු දෙයක් කියන්න ගත්තා.

“...අපි මොනවා කතාකරන්නද අයියා?...“

කෙල්ල ඕනවට එපාවට කියද්දිනම් මට ටිකක් තරහ යනවා. තරහ අමතක කරලා ආයෙත් කතාකරා.

“...මට දෙයක් කියන්න තියනවා...“

“..මොනවද අයියා.?“

“..මෙහෙම කියන්න පුළුවන්නම් එන්න කියනවද නංගෝ...“

කෙල්ල මොකුත්ම නොකිය අහගෙන හිටියා. මමනම් සටන අත අරින්නෙම නෑ.

“...එනවද කියන්න...“

“...හ්ම්ම්...“

අන්තිමේදි අකමැත්තෙන් වුනත් මම කැමතිම වචනේ කෙල්ල කිව්වා.

“..එළකිරි..එහෙනම් එනවා නේද ඔයා..“

“..හරි අයියා..ඒත් පොඩි වෙලාවකට..මම එහෙ මෙහෙ වැඩිය යනවට අම්මවත්..අයියවත් කැමති නෑ....“

“..හරි හරි නංගා..මට ඕන විනාඩි ගාණයි....“

“..හරි අයියා...“

“..එහෙනම් ලබන සෙනසුරාදා මම ඇවිත් ඔයාව ගන්නද?..“

“..නෑ අයියා මම එන්නම ටවුන් එකට...“

“...හරි නංගි එහෙනම් හවස හතරට...“

“...හරි අයියේ..එහෙනම් මම තියන්නම්..බුදු සරණයි..“

“...බුදු සරණයි...“

මම දුරකතනේ විසන්ධි කලේ රටක් රාජ්‍යයක් දිනුවා වගේ...ඉරු මාව මීට් වෙන්න එනෝ...මාරයි...

සෙනසුරාදා වෙනකන් හිත තිබුණේ කියාගන්න බැරි හදිස්සියකින් ගැහෙමින්. මම දන්නවා මම කියන්න යන දේ ඉරුදිකාගේ හිත දන්නවා කියලා. ඒත් ඒක නියම විදියට නොකිව්වොත් ආදරේ කරන මේ හිතට

අසාධාරණයක් වෙයි කියලා හිතන නිසා මේක කියන්න හොඳම අවස්ථාව ඇවිත් කියලා හිත කියනවා. ආදරේ කියන දේ හිතේ උපදින්නේ අහම්බෙන්.අහම්බෙන් උපදින ඒ සිතුවිල්ල කූටප්‍රාප්තියට ආවම ආදරේ අග්‍රඵලය විඳින්න හිත කියාගන්න බැරි තරමක ලෝබකමක් විඳිනවා.

ජීවිතේ ආදරේ හොඳම සිදුවීමක් විඳින්න පැමිණෙන මොහොතක ඒ සිදුවීමට හිත සූදානම් කරගන්න දවස් ගාණක් ගියා. ඒත් සෙනසුරාදට දවස් කීපයක් කලින් ඉරුදිකාගේ දුරකතනයට ඇමතුම් කීපයක් ගත්තත් දුරකතනය ක්‍රියාවිරහිතකර ඇති බව සුපුරුදු සුකුමක කටහඬකින් කිව්වා. කෙටි පණිවුඩ කීපයක්ම යැව්වත් එකක් වත් ගියබවට සලකුණක් ලැබුණේ නෑ. හිත අනියත බියකින් වෙලෙන්නට පටන් ගත්තා. ඉරුදිකාට කරදරයක්වත්ද? නෑ එහෙම වෙන්න විදියක් නෑ..එහෙමනම් මට දැනේවි..ඒත් ඇයි මෙහෙම එයාගෙන් කිසිම ආරංචියක් නැත්තේ. .

හිත ඉවසගන්න බැරි පාළුවකින් දුකකින් පෙලෙද්දි යන්තම් සිකුරාදා උදේ ඉරුදිකාගේ දුරකතනය නාදවෙන්න පටන් ගත්තා. දුරකතනයේ ටීක්..ටීක් හඬටත් වඩා වේගයෙන් හිත ගැහෙන්න පටන් ගත්තා..

“..හෙලෝ....“

මගේ සවන් ආසම කරන ඒ හඬ ඇහුණා..පුරුදු විදියටම පුරුදු ස්වරයෙන්ම.

“...නංගා..ඇයි මේ?...“

ඉරු අහන්න ඕන ප්‍රශ්නය ඇහුවේ මමයි.

“..ඇයි අයියේ එහෙම අහන්නේ...“

ඉරුදිකාගේ හඬ බිඳිලා වගේ දැනුනා. මටත් කතාකරගන්න තරම් වචන ආවෙත් නෑ. හිතට දැනෙන්නේ දුකක්ද සතුටක්ද කියලවත් වෙන්කරලා අඳුනගන්න පුළුවන් පැහැදිලි බවක් හිතේ තිබුණේ නෑ.

“..ඇයි නංගා ෆෝන් එක ඔෆ් පහුගිය ටිකේම. මුකුත් කරදරයක්ද?..“

ඉරු මගේ වෙනස් ස්වරයට වික්ෂිප්ත වෙලා වගේ උත්තරයක් දුන්නෙත් නෑ හරියටම. ඒත් ටිකකින් හඬ අවදි කලා.

“...නෑ අයියා පහුගිය ටිකේ වැඩ ගොඩක් තිබුණා..ඒකයි...“

දුරකතනය නිවා තබන්න කාර්ය බහුලත්වය එක හේතුවක් විතරයි කියලා මම තරම් හොඳින් දන්න කෙනෙක් නැතුව ඇති. ඒත් ඉරුදිකාගේ ස්වරයේ සහ ස්වභාවයේ වෙනස මගේ හිතට පුදුමාකාර වදයක් දුන්නා. මගේ විකාර කවි හිත ගොඩක් අසරණ වුණා.

“..හෙට හතරට එනවද නංගා...“

ටික වෙලාවක් නිහඬතාවයක් තිබුණා. මට ටිකකට හිතුණා හෙට හමුවීම සිදු නොවෙයිදෝත් කියලා.

“..එනවා අයියා..හැබැයි ගොඩක් වෙලා ඉන්න බෑ..“

ඒ වචන ටිකත් එක්ක හිතේ තිබුණු බර ගහගෙන ගියා වගේ දැනුණා. හිතුවෙම මේ සොඳුරු හමුවීම වෙන එකක් නෑ කියලා.

‘‘...හොඳයි නංගා..එහෙනම් හෙට මීට් වෙමු..පරිස්සමින් ඉන්න..‘‘

වැඩිවෙලා කතාකලොත් කෙල්ල බෑ කියයි කියලා හිතුනු බයට ද මන්දා දුරකතනය තියන්න හිතුනා.

‘‘..අයියත් පරිස්සමින් ඉන්න..බුදු සරණයි..‘‘

‘‘..බුදු සරණයි නංගා...‘‘

දුරකතනයත් එක්ක හදවතත් ටිකකට විසන්ධි වුණා.

*****************************************************

සෙනසුරාදා වරුවක් වැඩ කරලා ගෙදර ගිහින් ෆිල්ම් එකක් බලන එක හරි නැත්නම් එහා ගෙදර මල්ලිලා දෙන්නා එක්ක ක්‍රිකට් සෙල්ලම් කරන එක හරි පුරුද්දක් විදියට සිදුවුණා. ඒත් අද විශේෂ දවසක්. මේ සෙනසුරාදාව එනකං හිත කොච්චර බලං හිටියද. ඇල්ටො පොඩ්ඩත් අරගෙන පුඩ් සිටි එකට ගිහින් ආදරේ සංකේතයක් විදියට චොකලට් එකක් ගත්තේ දෙන්න වෙන දෙයක් හිතුණේ නැති නිසා. ඇවිත් වාහනේට නගිද්දිම වෙලාව හතරට කාලයි. දුරකතන ඇමතුමක් ගත්තේ ඉරුදිකා කොහේද බලන්න.

‘‘...හෙලෝ නංගා ඔයා කොහේද?...‘‘

ඇගේ පැත්තෙන් ඇහුණු සද්දෙත් එක්ක එයා බස් එකේ බව දැනුනා.

‘‘..මම ස්ටෑන්ඩ් එක ලඟ..අයියා දැන්ම එනවද..‘‘

හිතේ මලක් පිපුණා වගේ දැනුනා. එහෙනම් ඉරු මේ ආදරේ පිළිගන්න මගේ නෙත් මානෙටම ඇවිත්. අදනම් මාතර මල් සැණකෙලියක් වගේ දැනුනා. හරියට මට මාතර ටවුන් එක පෙනුනේ නිල්වලා හරසර ප්‍රදර්ශනේ දවස්වල රෑ වගේ.

‘‘...මම සෙන්තෝමස් එක ලඟ ඉන්නේ ..විනාඩියෙන් එනවා...ඔයා කොතනද ඉන්නේ..‘‘

‘‘...මම එස්.කේ එකට එහා කඩිර කැෆේ එක හරියෙන් ඉන්නම් අයියා...‘‘

“...හොඳයි නංගා...“

දුරකතනය විසන්ධි වුණ ගමන් එන්ජිම පණ ගැන්වුණා. බස් ස්ටෑන්ඩ් එක හරියටම යනකං මම ගියේ හීනෙන් වගේ. ඉරූ හිටියා වෙරළට හැරෙන වංගුවෙම. පුංචි මල් කුඩයක් දාගෙන. මල් මල් ගවුමක් ඇඳගෙන. ගවුමට ඉරූ ඉස්කෝලේ යන පුංචි කෙල්ලෙක් වගේ. දැක්ක ගමන් ඒකයි හිතුනේ. මම වාහනේ ඉරූ ලග නතර කරලා දොර ඇරියා. ඉරූ යන්තම් හිනාවෙලා ගොඩවුණා..

“...සොරි ලේට් වුණාට නංගා...“

“..නෑ අයියා මමත් දැන් ආවේ...“

ඉරූගේ මූණ ඇදිලා ගිහින් වගේ. ඇස්දෙකත් වෙනස් වෙලා. හරි මහන්සි පාටක් මට දැනුනේ. බලන්නත් දුකයි. ඒත් ඒ සිරියාවේ කිසිම වෙනසක් නෑ. ලැජ්ජාවත් බයත් මුසුවෙච්ච හැඟීමක් ඒ මුහුණේ දහ කලා.

මම අපි දෙන්නත් එක්කම ඇල්ටො පොඩ්ඩත් අරන් ගියේ වෙරළේ එහා කොණට. ලස්සන ෆයිනස් ගස් හෙවණට මම ගොඩක් ආසා කලා. කම්කරු උසාවිය ඉස්සරහා මේ ෆයිනස් හෙවනේ ඉස්සර අපි යාළුවොත් එක්ක කරපු වැඩ දැනටත් මතක් වෙද්දි හිනහයි.

ඉරිදා තරම් නැතිවුණත් අදත් වෙරළේ ගොඩක් සෙනග හිටියා. නිලාවේලි..ගාලු මුවදොර ඇරුණම ලංකාවේ ලස්සනම වගේම දිගම වෙරළ උද්‍යානේ අසිරිය විඳින්න කැමති ගොඩක් අය ඇවිත් හිටියා.

වාහනෙන් බැහැලා ෆයිනස් ගස් හෙවණේ බංකුව ලගට ගියපු මගේ පස්සෙන් කතානොකරම ඉරූත් ආවේ ඔරුවත් එක්ක යන කොල්ලැව වගේ. මම වාඩිවුණා..හිනාවෙලා ඉරූටත් වාඩිවෙන්න ඉඩ දුන්නා. මාතර කෙල්ලන්ගේ සුපුරුදු ආඩම්බර කමත් තුරුලු කරන් ඉරූදිකා අපිදෙන්නා අතරේ අඩියක පරතරයක් තියාගෙන වාඩිවුණා.

“...නංගා තැන්ක්ස් ආවට...“

“..ඒකට කමක් නෑ අයියා..මොනවද කියන්න තියනවා කිව්වේ...“

හිත ඒ මහා ආදර කතාව කියන්න සූදානම් වුණා. ලොකු හුස්මක් ගත්තේ එක සැරේටම කියන්න වගේ.

‘‘..ඔයාව දැක්ක මුල්ම දවසේ ඉඳන් දෙයක් මගේ හිතේ නලියනවා නංගා..ඒක කවියකින් ලියලා ඉවර කරන්නවත්..හුස්ම පොදකින් පිටකරලා හිත හදාගන්නවත් බැරි දෙයක්..ඒත් වචනෙකින් කියලා..ඇස්දෙක දිහා බලලා ජීවිතේටම තුරුලු කරලා තියාගන්න පුළුවන් දෙයක් නංගා..ඒක කියන්නයි ඔයාව මෙහෙම එක්ක ගෙන ආවේ..‘‘

ඇය ඇස් පුංචි කරන් බලන් හිටියා.

‘‘...මම ඔයාට ආදරෙයි නංගා...ගොඩක් ආදරෙයි..ජීවිතේ මගදි දාලා යන්නවත්...ඔයා වෙනස් වුණා කියලා වෙනස් වෙන්න වත් නෙවෙයි මේ ආදරේ..සදහටම ඔයා එක්ක එක තැනකම තියන්නයි..‘‘

ඉරුදිකා බිම බලාගත්තා හිතට බරක් එකතු කරලා. ඉරු ඊලගට ලොකු හුස්මක් අරන් මගේ දිහා බැලුවා. ආයෙත් බිම බලාගත්තා. මම ටිකක් ඉරුට ලංවෙලා අර අඩියේ පරතරය තරණය කලා. වෙවුලමින් තිබුණු ඒ සුදු අත්දෙකම මගේ අත්දෙකින් අල්ලගත්තා.

‘‘...දැනෙනවද ඉරු මේ ආදරේ...‘‘

ඉරු කඳුලු පිරුණු ඇස්දෙකත් එක්ක මගේ දිහා බැලුවා. මට හිතාගන්න බැරිවුණා ඒ ඇස්දෙකේ තිබුණේ මොනවද කියලා...

‘‘...දැනෙනවා අයියා...දැනෙනවා...ඒත් ප්ලීස් මට ආදරේ කරන්න එපා...ප්ලීස්‘‘

ඒ වචන ටික කඩුපාරවල් වගේ පපුව පලාගෙන ඇඟ ඇතුලට බැස්සා. ඇයි මම ඔයාට ආදරේ කරන එක නවත්තන්නේ. බෑ කවදාවත් බෑ.

‘‘...ඇයි නංගා එහෙම කියන්නේ...ඔයා කාටවත් ආදරේ කරනවද?..‘‘

ඉරු මගේ අත්දෙකෙන් ඒ සුදු අත්දෙක මුදාගත්තා. හරියට හිතට දුන්නු ආදරයක් ආයෙත් උදුරලා ගන්නවා වගේ.

"...ප්ලීස් අයියා මගෙන් මොකතු අහන්න එපා මේ ගැන...මට ආදරේ කරන්න එපා..ඒකෙන් ඔයාට ලැබෙන දෙයක් නෑ..මට මෙහෙම ඉන්න දෙන්න..මට ඔයාගෙ ආදරේ එපා..මම ඔයාට බෑ කියන්න බැරි කමටයි ආවේ..."

ඒ වචන මම කවදාවත් බලාපොරොත්තු වුණු වචන නෙවෙයි. ඉරුට දෙන්න ගත්තු චොකලට් එකත් තාම වාහනේ. ඒක අතට ගන්න වෙලාවේවත් මෙහෙම දෙයක් දැනුනානම්.මෙතනට එන්නේ හිත හදාගෙනයි..

"...ප්ලීස් එකපාරක් හිතන්න.."

ඉකිගහමින් හිටපු ඉරුට මම කිව්වා.

"..අනේ අයියා මම යන්න ඕන..ප්ලීස් මාත් එක්ක තරහ වෙන්න එපා. අයිය හොඳින් ඉන්න."

ඉරු බෑග් එකත් අරගෙන යන්න නැගිට්ටා. මට කරන්න කියන්න දෙයක් හිතාගන්න බැරිවුණා. මුළු මාතරම මම වටේ කැරකෙනවා වගේ දැනුනා. ලොකු සුසුම් ගණනාවක් පිටවුණා. ඉරු මගේ ලඟින් ගියා කියලවත් මට දැනුනේ නෑ. මම බලද්දි ඉරු ටික දුරක පයින් ඇවිදගෙන යනවා. මම දුවගෙන ගියා ඉරු ලගට.

"...ඉන්න ඉරු..මම ඔයාව දාන්නම්.."

කෙල්ල මුකුත්ම නොකිය නැවතුනේ තවත් මගේ හිත රිද්දන්න බැරි නිසාම වෙන්න ඇති. මම වාහනේ අරගෙන එතනට ආවා. ඉරු මොකුත්ම නොකිය නැගලා බිම බලාගෙන හිටියා. අපි අතර එක වචනයක් වත් හුවමාරු වුනේ නෑ. කඳුලු පිහිදගෙන ඉරු ඉස්සරහ බලාගත්තා.

ස්ටැන්ඩ් එක ගාවින් ඉරු බැස්සේ මගේ හිත පුදුම විදියට අසරණ කරලා.

"..පරිස්සමින් යන්න නංගා..."

ඔලුව වනලා ඉරු ස්ටැන්ඩ් එක ඇතුලට ගියා. හැඟුම් විරහිතවුනු මම කොහේදෝ යන්න ගියා.

****************************************************

“....ඔන්න ඕකයි වුනේ බං...“

නිසල්ගේ ගෙදර කාමරේ ඇද උඩ වාඩිවෙලා මම කතාව අවසන් කලා. නිසල් කට ඇරගෙන මම කියන දේ අහගෙන හිටියා.

“...ඇයි බං ඒ...“

නිසල් ඇහුව ප්‍රශ්නෙට උත්තරේ මමත් තාම හොයනවා කියලා එයා දන්නෑ.

“..මම දන්නෑ බං..මගෙත් ඔලුව අවුල් වුනා..කරන්න දෙයක් හිතාගන්න බෑ..“

මම ඇත්තම කිව්වා. කොච්චර වුනත් මගේ දුක නිසා නිසල් පවා කම්පනයෙන් හිටියේ.

“..ආයෙත් කෙල්ලට කතාකරන්න බැරිවෙයිද බං..“

නිසල් ඇහුවා.

“...මම හිතන්නනෑ බං ඒකි ආයෙත් කතා කරයි කියලා..කියන්න පුළුවන් සේරම කියලා ඉවර කරලනේ ගියේ...“

හිතේ දුකටයි වේගෙටයි මට කියවුණා. ඒත් හිතේ තිබුණේ මේකෙ කෙලවරක් දැනගන්න වුවමනාවයි.

“..දැන් උඹ මොකක්ද කරන්න හදන්නේ...“

නිසල් මගේ ලග ප්‍රශ්නාර්ථයක් තිබ්බා. මම ටිකක් කල්පනාකරලා තීරණේකට ඇවිත් නිසල් දිහා බැලුවා.

“...මම ඉරුදිකාලගේ ගෙදර ගිහින් ගෙදර අයගෙන් කෙලින්ම අහනවා බං...“

තීරණාත්මක තීරණය මම මුලින්ම නිසලයට කිව්වා.

"...ඔව් බං ඒක කෝකටත් හොඳයි...මොකද උඹට එහෙම ගිහිල්ලා අහන්න බැරිකමක් නෑ..මොනවද උඹේ අඩු..."

නිසල් මගේ තීරණය ස්ථිර කරා..ආදර කතාවේ වැදගත් සංධිස්ථානෙකට ඇවිත්. මටම දැනුණා ඒ දේ..

උදේ පාන්දර හිත දැඩි කරගත්තේ ජීවිතේ ගන්න වැදගත්ම වගේම තීරණාත්මකම තීරණයට මුහුණ දෙන්න. ඇල්ටො පොඩ්ඩට ගොඩවුණාම ඇල්ටෝ පොඩ්ඩත් ටිකක් විතර අදිමදි කරනවා වගේ දැනුනේ හිතේ බයටමද මංදා. ඒත් මාතර බෝධිය ගාවින් බැහැලා පඬුරක් දාලා වඳින්න අත්දෙක එකතු කරද්දි හිතට ලොකු හයියක් ලැබුණා වගේ දැනුණා. හක්මණ පාර දිගේ වාහනය ටික ටික ඉස්සරහට යද්දි ඉරුදිකාගේ දුරකතනයට ඇමතුවත් පුරුදු විදියටම දින කීපයක් පටන්ම ක්‍රියා කලේ නෑ. කමක් නෑ ඉරු මම කරන්න යන්නේ වැරදි දෙයක් නෙවෙයි. ඔයා වෙනුවෙන් වගේම මම වෙනුවෙනුත් කරන දෙයක්, ඒක නිසා මම මේ දේ කරනවමයි ඉරු.

තුඩාව හංදියෙන් හරස් පාරට වාහනය හරවද්දි හිතේ ගැස්ම පිස්ටන් එකේ චලනයටත් එහා ගිහින් තිබුණා. එදා ඉරුදිකා ගේට්ටුවෙන් ඇතුලු වුණු ගෙදර හොයාගන්න අමාරුවක් නෑ. වාහනේ ගේට්ටුව ලග නතර කරලා හිමින් ගේට්ටුව ඇරගෙන යද්දි කකුල් දෙක ගැහුණේ ජීවිතේ පලවෙනි වතාවට මේ වගේ දෙයක් කරන්න යන නිසා වෙන්න ඇති. හිතන්න තරම් වාතාවරණයක් හිතේ තිබුණේ නෑ.

ලස්සනට නිමකරලා තිබුණු මිදුල, මල්පැල, බංකුව හැමදේම කියලා දුන්නේ ඉරුගේ අත්දෙකේ ආඩම්බරකමයි හිතේ පිළිවෙලයි. මිදුලේ පැත්තකින් ඇදලා තිබුණු රෙදි වැලේ තිබුණු ඉරුගේ ඇඳුම් කීපයකින් මේ ඉරුගේ ගෙදරමයි කියලා සනාථ කලා. පුංචි පුනත් හරි පිලිවෙලට හදලා තිබුණු මිදුලත් හොඳ පිලිවෙලට නිමකරපු ගේ පොඩ්ඩත් නිසා හරි සිරියාවන්ත පෙනුමක් හිතේ ඇඳුනා. ගෙදර දොර ලඟම තිබුණු බෙල් එක නාද කරද්දි ඉවසගන්න බැරි විදියට හිත ගැහුනේ ඉරු ඇවිත් දොර ඇරියොත් මුහුණ දෙන්න වෙන තත්වය මතක් වෙලා. දෙපාරක් බෙල් එක නාද කරද්දි දොර කර..කරාස් සද්දෙත් එක්ක හිතේ බාගයක් ඉරාගෙන වගේ ඇරුණා. දොර ළඟ හිටියේ සාමාන්‍ය ගෙදරට අදින ඇඳුමකින් සැරසුණ මැදිවියේ කාන්තාවක්. නමුත් ඇයට ඉරුගේ පෙනුම තිබුණේ නෑ..

"...මේ..මේ...ඉරු..ඉරුදිකාගේ අම්මද?.."

ගොත ගැහෙමින් උනත් අමාරුවෙන් අහගන්න වුවමනා දේ ඇහුවා. මම දිහා ටිකක් සැකෙන් වගේ බලපු ඇය දොර සම්පූර්ණයෙන්ම වගේ ඇරියා.

‘‘...මේ දරුවා කව්ද?...ඔව් මේ එහේ තමයි...‘‘

විමසිල්ලෙන් වැඩිය මිත්‍රශීලී නොමැති විලාශයකින් ඇය මගෙන් ප්‍රශ්න කලා.

‘‘...අම්මේ මම සදීප..මට පොඩ්ඩක් අම්මා එක්ක කතා කරන්න පුළුවන්ද?..‘‘

හිතේ උපරිම ධෛර්ය භාවිතාවෙන් කියපු ඒ වචන ටිකේ අම්මා කියන නම ගැබ්ව තිබුණු නිසාද කොහේද ඇයට බෑ කියන්න බැරිවුණා. ඒත් ටික වෙලාවක් කල්පනා කරපු ඇය මට ඇතුලට ආරාධනා කලා.

‘‘...එන්න දරුවෝ ඇතුලට...වාඩිවෙන්න..මම ඉරුදිකාගේ අම්මා..‘‘

මම සාලේ සෝපාවෙන් වාඩිවුණා. හරි චාම් විදියට වැඩි විච්චූරණ නැතුව ගෙදර බඩු මුට්ටු සැරසිලි හැමදෙයින්ම අලංකාරය එක්කරලා තිබුණා. ඒත් ඉරු පේන්න හිටියේ නෑ. ඉරුගෙම පෙනුම තියන ඉරුගේ තාත්තා කියන්න පුළුවන් කෙනෙක්ගේ ඡායාරූපයකට සුදු මල්මාලයක් දාලා සාලේ එල්ලලා තිබුණා.

‘‘..මොනවද පුතාට මාත් එක්ක කතා කරන්න ඕන..‘‘

නිම කරමින් තිබූ මැහුමක් තිබූ පුටුවක් අසලම වාඩිවෙමින් ඉරුගේ අම්මා මගෙන් ඇහුවා.

‘‘....අම්මා..මම ඉරුදිකාව අඳුනගෙන ටික කලක් වෙනවා..මගේ හිතේ ඉරු ගැන බලාපොරොත්තුවක් තියෙනවා..ඒත් ඒක රහසින් කරන්න මම කැමති නෑ..මට අම්මලගේ ආශිර්වාදයත් ඕන..මම ඉරුව බඳින්න කැමතියි අම්මා.‘‘

මම කියපු ඒ වචන ටිකට ඇය ඇස්දෙක නලලේ තියන් වගේ මගේ දිහා බැලුවා. ඒ බැල්මෙන් යහපත් ප්‍රතිචාරයක් ලැබෙයිද යන්න මගේ හිතේ ගැටළුවක් ඇති කලා. අන්තිමට ඇය හඬ අවදි කලා.

‘‘...ඔය දරුවා ආවේ ඉරුදිකා ගැන මඟුල් කතා කරන්නනම් කරුණාකරලා දැන් මෙතනින් යන්න...ඔය දරුවා වෙන වැදගත් දෙයක් කතාකරන්න ආවා කියලා හිතලයි මම කතාකරන්න ඉඩ දුන්නේ ඒත්..ඔය දරුවා කියපු දේවල් කියලා ඉවරනම් දැන් යන්න..‘‘

ඇය හරිම අකාරුණික විදියට මම ගැන කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැතුව කියපු වචන් ටික නිසා හිත කියාගන්න බැරි තරම් අසරණ වුණා.ඇය අසුනින් නැගිට්ටේ සංවාදයේ සමාප්තිය සටහන් කරන්න වගේ

“..ඇයි අම්මේ එහෙම කියන්නේ..මම එහෙම නරක කෙනෙක් නෙවෙයි..මට වුට්ටක් කතා කරන්න දෙන්න..මම මාතර කෙනෙක් අම්මේ..මම හොඳ ජොබ් එකක් කරනවා. ජීවිතේ හැමදෙයක්ම මම පිළිවෙලට හදාගෙන ඉවරයි..ඇයි අම්මේ මගේ ඉල්ලීම ටිකක් සලකලා බලන්නෙ වත් නැතුව මෙහෙම කරන්නේ..“

හිතේ අසරණ කමටම කියවුනේ හරියට පොඩිකාලේ අම්මගෙන් ගුටි කෑවම හේතු කියවනවා වගේ. මගේ ස්වරයටද මන්දා ඇය ආයෙත් පුටුවේ වාඩි වුණා.

“..දරුවෝ ඉරුදිකා ගැන බලාපොරොත්තු තියාගන්න එකෙන් ඔයාට වැඩක් වෙන්නේ නෑ. අපි ඒ දේවල් පිළිවෙලක් කරලා දීලා ඉවරයි..ඔය දරුවා අනික් දේවල් පිළිවෙලක් කරගත්තා වගේ වෙන මගුල් තුලාවක් පිලිවෙල කරගන්න...“

ඇය තීරණාත්මක විදියට කිව්වා.

“..අම්මේ ඉරුදිකා මට ආදරෙයි..එයා මට කැමතියි..මම ඒක දන්නවා..ඉතිං මට මෙහෙම කරන්න එපා..“

ටිකක් කල්පනා කරපු ඇය මගෙන් ප්‍රශ්නයක් ඇහුවා.

“...පුතා ඉරුදිකා දන්නේ කොහොමද..“

“..මට එයාව අහම්බෙන් මුණ ගැහුණේ..ඒත් අපි දෙන්නා දැන් හොඳට අඳුනනවා..“

ඒත් ඇගේ ස්වරය වෙනස් වුනේ නෑ.

“...කරුණාකරලා ඔය යෝජනාවත් අරං යන්න..මම කැමති නෑ ඔය දරුවා නාස්ති වෙනවට..“

අන්තිම වචන ටික කියද්දි ඇයට ඇඩෙන්න ආවා..මට ඒ වචන ටික දෝංකාර දීලා ඇහුණා..මම ඇය ලගට ගියා.

"..ඇයි අම්මේ එහෙම කියන්නේ..ඉරු ලංවුණා කියලා මගේ ජීවිතේ විනාස වෙන්නේ නෑ..ඇයි මේ කියන්න..මොකක්ද ප්‍රශ්නේ අම්මේ..."

ඒ වෙනකොට ඇයට හොඳටම ඇඬුම් ඇවිත් තිබුණා. ඒත් වචනයක්වත් කියාගන්න බැරිතරමට ඇය අසරණවෙලා..අන්තිමට ඇය මහ හඩින් අඩමින් දෙයක් කිව්වා..

"..දරුවෝ ඉරු කියන්නේ ලෙඩෙක්...ජීවිතේ ගැන බලාපොරොත්තු තියාගන්න බැරි තරම් ලෙඩෙක්..එහෙම පහුරක නැගලා ඔය දරුවා කොහොමද ජීවිත ගඟෙන් එගොඩ වෙන්නේ.."

ඒ වචන ටික කිව්ව ගමන් මුළු ගෙදරම මගේ වටේ කැරකිලා යනවා දැණුනා. මට එච්චරවත් දෙයක් දැනුනා පුදුමයි.

*****************************************************

අසුනේ ඉඳගත්තු ඉරුගේ අම්මා මම මෙතෙක් දැනගෙන නොහිටපු කතාව කියන්න පටන් ගත්තා.

"...පුතේ ඉරුදිකා කියන්නේ මගේ දෙවනි දරුවා..ධනංජය පුතාගේ නංගි..දරුවෝ දෙන්නම පොඩිකාලේ ඉඳන් හරි එකමුතුයි පිලිවෙලයි..හැමදේම කලේ එකටම වගේ. ඉරු හොඳට ඉගනගත්තා. පොඩිකාලේ ඉඳලම සුජාතා එකේ හොඳ නමක් තියාගෙන ඉගන ගත්තා. ..."

"...චූටි දුව අපි හැමෝගෙම ආදරේ යට තමයි හැදුනේ..එයා ඒ ලෙවල් වලට බයෝ සයන්ස් තෝරගත්තේ එයාගෙම කැමැත්තට..අයියත් එයාට ගොඩක් උදව් කලා..දරුවා හොඳට පාඩම් වැඩ කලා පන්ති ගියා..වෙන කිසිම දෙයක් ගැන හිතුවේ නෑ..පුංචිවත් වරදක් අපි කාටවත් කලේ නෑ..ඒත් දවසක් එයාගෙම වයසේ දරුවෙකුත් එක්ක පුංචි වාදයක් ගිහිල්ලා ඒ ගෑණු දරුවා චූටි දුවට අභියෝග කරලා තිබුණා..ඒ තමයි පුළුවන්නම් බයෝ සයන්ස් වලින් මාතර දිස්ත්‍රික්කේ පලවෙනියා වෙන්න කියලා..චූටි දූත් ඒක බාරගෙන තිබුණේ තමන් ගැන විශ්වාසෙ තියාගෙන..එදා ඉඳන් එයා පිස්සුවෙන් වගේ පාඩම් කලා..කන්නෙ බොන්නේ නැතුව..නිදිමරාගෙන වෙන කිසිම දෙයක් ගැන හිතන්නේ නැතුව පාඩම් කලා.."

"...ඒත් හදිස්සියෙම දූ ලෙඩවුණා..අපි කව්රුත් ගොඩක් බයවුණා..විභාගේ ලග තියෙද්දි ඉරුදිකාට පිට් එක වගේ ආවා..දොස්තරලා බලලා කිව්වේ අධික විදියට මනස හා ඇඟ වෙහෙසකරපු නිසා

කියලා..අවාසනාවකට මේ ලෙඩේ නිසා චූටි දුව ගොඩක් බලාපොරොත්තු තියන් වැඩකරපු ඒ ලෙවල් විභාගෙ ලියන්නත් බැරිවුණා..ඒකෙන් එයා තවත් කම්පනයට පත්වුණා..අපි හැමෝම එයාගෙ හිත හැදුවත් එයා කාත් එක්කවත් කතානොකර පැත්තකට වෙලා දුක්වින්දා...කරදර පිට කරදර ඇවිත් ඉරුදිකාගේ අප්පච්චිත් අපිව දාලා ගියේ දරුවා කබලෙන් ලිපට දාන්න වගේ..චූටි දුවගේ තාත්තා වැඩකලේ හමුදාවේ කර්නල් කෙනෙක් විදියට..පුනරින් වලදි බෝම්බයක් පුපුරලා මැරුණේ රට ජාතිය වෙනුවෙන්..ඒත් මගේ දරුව ඒක විඳගන්න පුළුවන් තත්වෙක හිටියෙ නෑ..තාත්තගේ හත් දවසෙ දානෙට පහුවෙනිදා චූටි දූට හොඳටම අමාරුවෙලා මාතර ඉස්පිරිතාලෙට ඇතුල් කලා..ගොඩක් අමාරුයි කියපු නිසා අන්තිමට කරාපිටියට එක්කගෙන ගියා..දවස් පහක් තිස්සේ දරුවා දැඩි සත්කාරෙ හිටියා..දරුවගේ ජීවිතේ බේරුනේ නූලෙන් වගේ..මානසික කම්පනය නිසා දරුවගේ ස්නායු වල මොකක්ද වෙනසක් වෙලා කියලා කිව්වා..දොස්තරලා කියපු දේවල් වලින් තේරුණා දරුවට ගොඩක් අමාරුයි කියලා..ඔපරේෂන් කරොත් දරුවගේ ජීවිතය නැතිවෙයි කිව්වා..දරුවට පාඩුවෙ ජීවත් වෙන්න දෙන්න කිව්වා පුතේ..කිසිම බරපතල දෙයක් හිතන්න, දුක්වෙන්න දෙන්න එපා කිව්වා.කරාපිටියෙන් ගෙදර එක්කගෙන ආවේ මලමිනියක් වගේ..ඒත් බෙහෙත් වලින් දරුව ටිකක් පණ ගහලා ආවා..පස්සේ ටික ටික වැඩ කරන්න පටන් ගත්තා..එහෙ මෙහෙ යන්න පුළුවන් කාලෙ ආවට පස්සේ ටවුන් එකට යාළුවන්ගේ ගෙවල්වල යන්න පටන් ගත්තා..දොස්තරලා කියපු දේවල් නිසා අපි වැලැක්කුවේ නෑ..“

“...ඒත් ඒ හැමදෙයක්ම අස්සේ එකම එක කෙනෙක් නොදැනීම චූටි දූට ලංවුණා..ඒ තමයි චරිත්..ගාල්ලෙ මහමෝදර දරුවෙක්..එයා ඉරුව බඳින්න කියලා අපෙන් ඇහුවා..ඒ වෙනකොට දෙන්නා ගොඩක් ලංවෙලා හිටියා..ඒත් අපි දොස්තරලගෙන් ඇහුවම කියපු දේට අපි කාටවත් මුකුත් හිතාගන්න බැරිවුණා..දොස්තරලා කිව්වා කසාද බැඳලා දරුවෙක් හදන්න වගේ ලොකු වගකීම් ගන්න චූටි දූට බැරිලු එහෙම වුනොත් එයාගේ ජීවිතේ කෙලවර ඒ වගේ දේකින්ම වෙන්න පුළුවන් කියලා..අපි හරි අසරණ වුණා..අපි චරිත් පුතාට හැමදේම තේරුම් කරලා දුන්නා..ඒත් එයා මේ හැමදෙයින්ම බයවුණා..එයා හිතන්න බැරි ඉක්මණින් චූටි දූගෙන් ඈත්වුනේ අපි තවත් අසරණ කරලා..චරිත් මගඅරිද්දි චූටි දූ එයාගේ ආදරේ හොයාගෙන ගියා..ඒත් චරිත් පුතා ඉරුගෙන් සම්පූර්ණ ඈත්වුණා..එදායින් පස්සේ ඉරු ආයෙත් ලෙඩවුණා..දොස්තරලා අපිට නොසෑහෙන්න බැන්නා...ලෙඩවෙලා හිටිද්දිවත් චරිත් පුතා ආවෙ නෑ බලන්න..ඒ දරුවා සාධාරණයි..මම ඒකමයි ඔය දරුවටත් කියන්නේ මෙහෙම...මගේ දරුවට තව දුක්විඳින්නත් බෑ..එහෙම වුනොත් එයා මැරිලා යාවි..පහුගිය දවස්වල ආයෙත් බෙහෙත් බොන්න බෑ කියලා ලෙඩේ වැඩිවුණා..හවස හය හත පහුවෙද්දි ඔළුව බදාගෙන පිස්සුවෙන් වගේ කෑ ගහනවා..ඊට පස්සේ උදේ දහය විතර වෙනකන් නිදාගන්නවා..ඔය අදත් තාම නිදි..අනේ රත්තරන් පුතේ වැඳලා කියන්නම් මගේ දරුවගේ හිත කඩන්නේ නැතුව එයා ආයෙත් ලෙඩෙක් නොකර එයාටත් නොදැනෙන්න මේ දේ නවත්තන්න..මම දරුවට වඳින්නම්..“

අම්මව වලක්වමින් මම නැගිට්ටා. මොනවා කරන්නද? මොනවා කියන්නදි හිතාගන්න බැරුව මම නැගිට්ටා.

“..අනේ එපා අම්මේ..මට හැමදේම තේරෙනවා..මම යන්නම්..ඒත් චරිත් වගේ නෙවෙයි..මම ආයෙත් එනවා..එදාට මට දොර වහන්න එපා..“

අවසිහියෙන් වගේ පාරට බැස්සේ කිසිම දෙයක් හිතාගන්න බැරුව.. වෙච්ච හැමදෙයක්ම හීනයක් වගේ.

*****************************************************

“....මම දන්නවා මගේ පුතේ ඔයා වැරදි දෙයක් කරන්නේ නෑ කියලා..ඔයා කරන හැමදෙයක්ම හිතලා බලලා කරන්න..ඔයා හැමදේම මට කියපු එක හොඳයි හැමදාම වගේ..ඒ දරුවා ලෙඩෙක් කියලා නොදැන ලංවුණාට ඒ වෙනුවෙන් ඔයාට කරන්න පුළුවන් දෙයක් තියනම් නොකර ඉන්න එපා...“

ගෙදර ගිහින් අම්මා ළඟට වෙලා හැමදේම අකුරක් නෑ කිව්වම අම්මා කිව්වේ මගේ හිත හැදෙන්න දවස පුරාවට ඇහුණු එකම වචන ටික.

“...ඔව් අම්මේ ඉරු හරි හොඳයි කිසිම වරදක් නෑ..ඒකයි මම එහෙම කෙලින්ම ගිහින් ඇහුවේ..“

“..මම දන්නවා පුතා ඔයා නරක කෙනෙක්ට එහෙම ලංවෙන්නේ නෑ කියලා..ඒත් හැමදේම තව හිතන්න..දැන් අක්කා පිළිවෙලක් වෙලා නිසා එයා ගැන බලන්න දෙයක් නෑ..මගේ හිතේ බර ඔයා ගැන තමයි...“

අම්මා කියපු ඒ කතාවෙන් මගේ වගකීම ගැන මට වැටහුණා. ඒත් ඉරු කියන්නේ මගේ ජීවිතේ කොටසක් වෙලා ඉවරයි.

“...ඒත් ලොකුම ප්‍රශ්නේ තියෙන්නේ ඉරු මට ආදරේ කරලා වැඩියෙන් ඒක ගැන හිතුවත් ඒක එයාගේ ජීවිතේට අවදානම්..ඒ වගේම මම වෙන්වෙලා ඒක දරුණුවට දැනුනොත් ඒකත් ඉරුට අවදානම්..ඒකයි එයාලගේ අම්මා කැමති නැත්තේ...“

ජීවිතේ හිතපු නැති පැත්තකට යන්න පටන් අරන්. ඒ ගලාගෙන යන ජීවිත ගඟ කොහේට යාවිද කියලා මටත් හිතාගන්න බෑ.

හිතේ තිබුණු නිදහස කොහේදෝ පාවෙලා ගිහින් මේ .අරගෙන පටන් වෙන්න වෙනස් හැමදෙයක්ම . සිතුවිලිගංගාව කොහේ ගිහින් කොහේ නතර වෙයිද කියලා හිතාගන්නත් බැරි තරම් සංකීර්ණ වෙලා . සැලුනේ කවදාවත් ඒවට ඒත් .අනන්තයි වාර ගියපු දුරට ඇවිත ළඟට ගොඩක්ම දේ කියන ආදරේ ජීවිතේ .වෙනස්වෙලා විදියට වැනෙන හුළඟටත් පුංචි අද හිත මගේ හිටපු වගේ මහමේරුවක් නැති

ඉරුදිකා හුළඟක් වගේම මගේ ජීවිතේට ඇවිත් හිතට මහා දුකක් ඉතිරි කරලා යන්න හදනවා. එයාට යන්න දුන්නොත් කවදාවත්ම මගේ හිත මට සමාව දෙන එකක් නෑ.

මම උදේම හිතාගත්තු විදියටම ඉරුදිකාගේ ගෙදරට ආයෙත් යන්න පිටත් වුණා. අම්මටත් කිව්වා යන ගමන ගැන. ඉරුගේ ගෙදර අය මොනවා කියයිද කියලා හිතේ අදහසක් තිබුණේ නෑ ඒත් මට ඕන වුනේ

ඉරුදිකා වෙනුවෙන් කව්රු නැතිවුණත් මම ඉන්නවා කියන එක කෑගහලා ඒ අයට කියලා දෙන්න. ඒ වගේම දවස් ගාණක් තිස්සේ නොදැකපු ඉරුගේ රත්තරන් මූණ බලලා ටිකක් හිත හදාගන්න. ඒ මූණ දැක්කත් ඇති මගේ ජීවිතේම මගෙන් ඈත් කරන්න. .

හිස් අතින් යන්න හිතට මදි හින්දා වෙලේවත්තේ නිව් නෙප්චූන් එකෙන් බිස්කට් එකක් අරගත්තා. මේ වගේ වෙලාවක ගෙනියන් ඕන මොනවද කියලවත් හිතේ තිබුණේ නෑ. ඒත් මහ හයියක් වගේ එකෙක් මගේ වම් පැත්තේ අසුනේ හිටියා..නිසල්..මගේ හිතට මේ වෙලාවේ හයියක් වෙන්න නිසල් ආපු එක් ලොකු දෙයක්. මේ වගේ වෙලාවක ආයෙත් ඉරුලගේ ගෙදර ගිහින් ප්‍රශ්නයක් වුනොත් ඒක නිරාකරණය කරගන්නත් එක්කමයි නිසල් ආවේ. අපි හෙමින් හෙමින් තුඩාව පැත්තට ආවා

**********************************************

‘‘...දරුවෝ දෙයියන්ගේ නාමෙන් කියන දේ අහන්න..ඇයි ආයෙත් මගේ දරුවට දුක් දෙන්න එන්නේ...‘‘

ඉරුදිකාගේ අම්මගේ බෙරිහන් දීමට කාමරේ හිටපු ඉරුගේ අයියා ධනංජයත් ආවා. අයියා ඉන්නවා කියලා දැනගත්තම හිත පොඩ්ඩක් ගැස්සුනත් නිසල් හිටපු නිසා ඒක ඒ තරම් ගැටළුවක් වුනේ නෑ. ඒත් අතින් බල බල හිටපු පත්තරෙත් අරගෙන ආපු ධනංජය ටිකක් නුදුරින් ඉඳන් අම්මට ප්‍රශ්නය නිරාකරනය කරගන්න ඉඩදුන්නා.ඔහුගේ මුහුණෙන් පෙනුනේ මේ ගැටළුව ගැන ඔහු දැනුවත් කියලයි.

‘‘...අම්මේ මට එහෙම ඉරුව අමතක කරලා යන්න බෑ..ඉරු ඉන්නේ මොන තත්වෙක උනත් මම ඉරුව බාරගන්නවා..‘‘

ඉරුගේ අම්මාගේ කෑ ගැසීම ඉක්මවා ගියපු මගේ කෑ ගැසීමට කාමරේ දොර රෙද්ද අතරින් මතුවුනේ බියට පත්වුණු ඉරුගේ සුන්දර මූණ..අනේ දෙයියනේ මාව පිස්සු වට්ටවපු..මට ජීවිතේට නැති ආදරයක් මතුකරලා දීපු ඒ රත්තරන් කෙල්ල කාලෙකට පස්සේ දකිද්දි හිතේ තිබුණු කිසිම දෙයක් කියාගන්න මතක් වුනේ නෑ. මතක තිබුණේ ඒ මූණ විතරමයි. අමුතුම දෙයක් ඒ මූණෙ ලියවිලා තිබුණා..බලාපොරොත්තුවක් වගේ දෙයක්. .

ප්‍රශ්නය සමථයකට පත්කරන්න නිසල් මොනමොනවද අම්මට කිව්වා මතකයි. ඒ පාර අයියත් ඇවිත් අම්මට යමක් කිව්වා. අපිට අසුන් ගන්න ඉඩ ලැබුණා. ධනංජය අයියත් අපි ඉස්සරහ පුටුවෙන් වාඩිවුනා. ඉරු පේන්න හිටියේ නෑ. .

‘‘...මල්ලි මම දන්නවා ප්‍රශ්නේ..ඒ වගේම මල්ලිට වරදක් කියන්න බෑ කියලත් මම දන්නවා..ඒත් එක

සැරයක් වෙච්ච දේ නිසා අම්මා වගේම මමත් මේ දේට විරුද්ධයි..ගිනි පෙලෙල්ලෙන් බැටකාපු අපි කණාමැදිරි එළියට හරි බයයි මල්ලි.“

.

බොහොම ගැඹුරු විදියට හිතලා ඔහු කතා කලා.

“... මම දන්නවා අයියේ..ඒත් ඉරූ මොන තත්වෙක හිටියත් මම එයාව දාලා යන්න සූදානම් නෑ. ඒ මම ඉරූට අවංකව ආදරේ නිසා. මට ඉරූව අමතක කරලා ගිහිල්ලා අනික් පැත්තට කෙනෙක්ට ලංවෙන්න පුළුවන් නම් මම ඉරූට ආදරේ කරලා නෑ..එදා ඉරූ මට කියලා ගියා එයාට ආදරේ කරන්න එපා කියලා..ඒකට හේතුවක් ඇති කියලා මට හිතුණා. එයාගෙ අසරණ කමට ඒක කිව්වට හිතේ තිබුණේ ඒ දේ නෙවෙයි කියලා මම දැනගෙන හිටියා..ඒකයි මම එයාව අමතක කලේ නැත්තේ..ඒත් එදා එයා කිව්ව පලියට මම එයාව අමතක කරලා වෙන කෙනෙක්ට ලංවුණා නම් අද ඉරූ තවත් දුක් විදිනවා..එහෙනම් මම එයාට ආදරේ කරලා නෑ කියලා කව්රුත් කියාවි..ඒත් මම ඉරූට ලංවුණේ එයාව ඕන අසරණ කමකදි දාලා නොයන්න බලාගෙන.“

මම හදවතින් ම කියපු වචන ටිකට ධනංජය අයියා මත්වෙලා වගේ බලන් හිටියා. ටිකක් බල්න ඉඳලා හඬ අවදිකලා.

“... මට තේරෙනවා මල්ලි ඔයාගෙ අදහස්..ඒත් මට බෑ කොල්ලෙක් විදියට ලෙඩ කෙල්ලෙක් උඹේ කරේ පටවන්න...ඒක කරන්න මට බෑ..ඒ කෙල්ල මගේ නංගි වුනත්..උඹ ඒක තෙරුම් ගනින් මල්ලියේ...“

බොහොම ලෙංගතු විදියට ධනංජය කියපු ඒ කතාවෙන් අයියගේ අදහස් හැමදේම තේරුණා.

“...ඉරූ ව එහෙම අතඇරලා දාන්න බෑ අයියා..මම කොහොමහරි ඉරූප සනීප කරගන්නවා..මෙහේ බැරිනම් පිටරටකට හරි ගෙනිහින්..“

මගේ ධෛර්ය ගැන ධනංජය අයියා වගේම නිසලුත් පුදුම වෙලා වගේම ආඩම්බරයෙන් බලන් හිටියා.

“...අපි කොච්චරනම් උත්සහ කලාද මල්ලි..ඒත් බැරිවුනා..බැරිම තැන එයාට ඉන්න ටික කාලෙ නිදහසේ ඉන්න දුන්නා..ඒ නිදහස එයා එයාගෙම අවාසනාවට හරවගෙන..මම දන්නෑ උඹට මොනවා කියන්නද කියලා..ඒත් උඹේ කැමැත්ත ඒකනම් මමවත් අම්මවත් ඒකට විරුද්ධ වෙන්නේ නෑ..ඒත් අර එකෙක් වගේ මගදි යනවනම් මගේ නංගිව මරලා දාලා පලයන් එදාට..මොකද ඒක ඒකිට සැනසීමක් වෙයි..“

“මගේ උරේට අතක් තියලා අයියා කියපු කතාවට මගේ ඇස්දෙකටත් කඳුලු ආවා. ධනංජයගේ අත මම අල්ලගත්ත විදියෙන් එයා තේරුම් ගත්තා මම කවමදාකවත් එහෙම දෙයක් නොකරන බව..ධනංජය අපි දෙන්නව තනි කරලා ඇතුලට ගියා.“ .

ටිකකින් තේ අරන් ආවේ අම්මා නෙවෙයි ඉරූ..දෙයියනේ දැන් ඉරූගේ ගෙදරින් බාධාවත් ඉවරයි. මගේ හිතේ බාගයක් සැනසුමෙන් පිරුණා..ඒත් ඉතිරි බාගේ පුරවන්න පුළුවන් වෙයිද?..හිතට බයක් දැනුනා.

ලස්සන මල් මල් ගවුමක් ඇඳලා කොණ්ඩෙත් නිදැල්ලේ දැගලිල්ලට ඉඩදීලා ආපු ඉරූ දැක්කම හිත් සන්තානෙම එලිය වුනා..ඉරූ අපි දෙන්නා ලගට ආවේ බයෙන් වගේ. මට සහ නිසල්ට තේ අල්ලලා යන්න හදද්දි මම නැගිටලා ඉරූව නැවැත්තුවා. .

“... මම ඉන්නවා ඔයා එක්ක...ඔයා ඉන්නවද මම වෙනුවෙන්?.“ .

මම අහපු ප්‍රශ්නෙත්.ඉරූ බලපු විදියත් අර්ථය පහදන්න බැරි කවියක් වගේ වුනා. .

“... බෑ කියන්නනම් එපා වස්තුවේ..නාදුගල වේල්ලටත් වඩා හිත හයියකරන් ආවට ඔයාගේ ඒ තනි අකුරේ උත්තරේ ලැබුණොත් මට වෙන්නේ නිල්වලා ගගට පනින්නම තමයි.“ .

එකපාරටම ඉරූට ඇඬුම් ආවා. ඉකි ගගහා ඇඬුවා. ඉකි ගගහා අඩන ඉරූව මගේ උරේට හේත්තු කරගද්දි අපිට බාධා නොකර නිසල් තේකත් අරන් එලියට ගියා. ඉරූ මගේ පපුවේ මූණ ඔබාගෙන ගොඩක් ඇඬුවා ඒ කඳුලු කැට මගේ කමිසය පුරා ගලාගියේ හදවත තෙත් කරමින්..මම ඉරූගේ ඔළුව අතගෑවේ හිත දෙදරමින් තිබුණ සිතුවිල්ල අතරින්මයි. .

“... මම ඉන්නවා අයියා...ඒත් මම යන්න බලන් ඉන්න කෙල්ලෙක්. “ .

ඉරූ අඩමින් කියපු කතාව ඇත්තම වුනත් මගේ හිත පිළිගත්තේ නෑ. යන්න කලින් තත්පරයක් හරි මේ ආදරේ ඉරූට දෙන්න ඒ ආදරේ මගේ හදවතේ තියාගන්න ලැබුණු එකම මට ඇති. මටත් හිතුණා ඉරූ එක්කම යන්න. .

“..පිස්සුද කෙල්ලේ..මේ කොල්ලා ඉන්නකම් යන්න දෙනවද ඔයාට...මාතර කොල්ලෝ හොඳ හදවතක් තියනවා වගේම ඒ හදවත හයියනම් ඒවයින් කරන්න බැරි දේවලුත් කරනවා...මම ඔයාට යන්න දෙන්නේ නෑ..“

ඉරුදිකා තුරුලුවෙලා තවත් ඇඩුවා. ටිකකින් හැමදේටම විරාමයක් තියලා ඉරු ඇතුලට ගියා. අපි දෙන්නා ගෙදර අයගෙන සමුගත්තා. අම්මට වඳිද්දි ඇස් කඳලිනි පෙඟිලා තිබුණා..තෙරුවන් සරණයි පුතේ..පරිස්සමින් යන්න දරුවනේ..කිව්වේ හදවතින්මයි. .

අයියටත් සමුදීලා ඉරු ලඟටත් ගියේ කාට සමුදුන්නත් ඒ රත්තන් හිතට සමුදෙන්න බැරි විදියට මුළු සංසාරෙම බැඳිලා ඉවර නිසයි. .

..මම යන්නම් ඉරු..මම ඉක්මණට එනවා...ඒත් හිස් අතින් නෙවෙයි..ඔයාව මාත් එක්කම තියාගන්න පුළුවන් දේකුත් අරගෙනම. .

ඉරු හිනාවුනා. කඳුළු අතරින්. අපි දෙන්නා යන්න ආවා ආයෙත් පුරුදු පාරෙම ඒත් මහා ගොඩක් දේවල් හිතින් අරගෙන. .

*****************************************************

"....මචං උඹට මතකද ජීවා?.." .

ඊට පහුවෙනිදා හවස මගේ කාමරේදී නිසල් එක්ක කතාවක් දාගෙන ඉන්න වෙලාවක හදිසියෙම මතක් වුන දෙයක් මම නිසල්ගෙන් ඇහුවා. .

"...කව්ද අර සර්විසස් ගියපු කළු උස එකා නේද?..අර බං කොන්වන්ට් එක ඉස්සරහදි තීන්ත බකට් එකක් කෑවේ..."

"...අන්න හරි මචං..ජීවන්තයා තමයි...මට ඌ දැන් අවුරුද්දකට විතර කලින් රාජගිරියෙදි මීට් වුණා..ඌ කිව්වා ඌ දැන් ඩොක්ටර් කෙනෙක් කියලා..ස්නායු සම්බන්ධව..මම හිතන් ඉන්නේ ඉරුව ජීවන්තයට පෙන්නන්න.."

මගේ අදහස මම නිසල්ට කිව්වා. .

"..ඒක හොඳයි බං..කොහොමටත් ඉක්මණට කරන එක හොඳයි..දැන් හැබැයි කෙල්ල ඇත්තේ සතුටින්."

ඉරුගේ සතුටු මූණ මට මැවිලා පෙනුනා. .

"...ඔව් මචං මට ඌ කාඩ් එක දුන්නා මේ කොහේ හරි ඇති. ටිකක් රෑ වෙලා කෝල් එකක් දීලා බලන්න ඕන බං." .

"..ඔව් ඔව් ඒක හොඳයි..ඌ මොන හොස්පිටල් එකේද වැඩකරනවා කිව්වේ." .
.

"මට කිව්වේ ඇපලෝ එක කියලා. දැන් ඒක් ලංකා හොස්පිටල්ස් නේ බං.ඌ රට ගිහින් ඇවිත් තියනවා. ඒක නිසා ඌට පෙන්නුවොත් මගේ හිතටත් හොඳයි බන්." .

හිතට ආපු අදහස එදා රෑම ක්‍රියාත්මක කලා. ජීවා බොහොම හොඳින් මම කියපු විස්තර ටික සේරම අහගෙන හිටියා. අපි ඉස්කෝල කාලේ කරපු පිස්සු වැඩත් ඒ අතරේ ජීවා මතක් කලා.

"..හරි සදීපයා...මට තේරෙනවා වැඩේ...උඹ පේෂන්වත් අරගෙන වරෙන් මාව මීට් වෙන්න."
.

"..හරි මචං..කෙල්ල එච්චර කැමති නෑ ට්‍රීට්මන්ස් වලට..ඒත් මම කතාකරන් එන්නම් මචං. " .

"..ඔව් ඔව් කෙල්ලෝ කොහොමත් ටිකක් ලෙඩ එක්ක පණ්ඩිතයි..උඹ කියන විදියටනම් කේස් එක සීරියස් මචං..ඒත් අපි අදහස අතඇරගන්නේ නැතුව බලමුකෝ." .

"..හොඳයි මචං ජීවා..මම කොහේටද එක්කන් එන්න ඕන..?" .

"..මම ගෝල් එනවා..සදර්න් එකට බ්‍රහස්පතින්දා හවස..උඹ මුලින් කෙල්ල එක්කන් එන්න ඕන නෑ..රිපෝට්ස් ටික අඩු නැතිව මට ගෙනැත් දීපන්..මම ඒවා බලලා ඩිසයිඩ් කරන්නම් මොනාද කරන්න පුළුවන් කියලා..මගේ අඳුනන අනිත් ඩොක්ටර්සලාගෙනුත් උදව් ගන්න පුළුවන් වෙයි.."

ජීවන්තගේ වචන මට අමෘතය වගේ දැනුනා. නියං කාලෙට වැටෙන පුංචි පොද වැස්සක් වුනත් කොච්චර වටිනවද කියලා දැනුනා. .

“...උඹට ගොඩක් පිං මචං..කරන උදව් වලට..“ .

“..හරි හරි බං අපි මාතර මිනිස්සු...අපේ එවුන්ට නොකරන ඒවා කාට කරන්නද..“ .

“...හොඳයි මචං..එහෙනම් මම තියන්නම්..බායි.“ .

“..බායි මචං.“ .

දුරකතනය විසන්ධි කරලා ටික වෙලාවක් කල්පනා කලා. අනේ දෙයියනේ මේ වෙලාවේ මේ දේ හරියනවනම් මට මගේ ජීවිතේ නැතිවුනත් ඇති. ඉබේම එහෙම හිතුනා..

ජීවිතේ එක පැත්තකින් ගෙවුනේ සතුටින්. ඒ මොකද කවදාවත් ජීවිතේට නොහිතපු කෙල්ලෙක් අහම්බෙන් හමුවුණා. ඒ හමුවීම හිතේ ආදරේකට කප් රුකක් හිටවලා ගියා විතරක් නෙවෙයි අන්තිමට ඒ ආදරේ ලංකරගන්න යන්තම්හරි ඉඩක් ලැබිලා. ජීවිතේ එක පැත්තකින් ඒ විදියට සතුට දෙද්දි අනිත් පැත්තකින් ලොකු දුකකුත් ඉතිරි කරලා. ඒ ඉරුදිකාගේ අසනීපේ. ඉරුගේ ඉස්සරහා වීරයා වගේ අසනීපේ තුච්චුවට දාලා කතාකරාට තනියම ඉන්න හැමවේලේම හිතට වද දුන්නේ ඉරුදිකා නැතිවෙයි කියන බය. ඒත් ඉරු ඉන්නේ සතුටින් නිසා එහෙම දෙයක් බුදුන්ගේ සරණින් වෙන එකක් නෑ කියලා හිත කියනවා. ඒත් ගස් ගල් වගේ ඉන්න මිනිස්සු මැරිලා යද්දි කොහොමද හිත හදාගන්නෙ කියලා හිතාගන්නත් බෑ.

ඉරුව බලන්න ඉඩක් ලැබුණු හැමවෙලාවකම ගියා. එයත් එක්ක ගෙදරින් පිට ගියේ නැත්තේ ලෙඩේ ගැන ගෙදර අය ටිකක් කලබල වෙලා හිටපු නිසයි. අනිත් හැමවෙලාවකම කෝල් කරලා හරි අඩුම ගානේ කෙටි පණිවිඩයකින් හරි ඉරුදිකා මගේ ලඟ තියාගත්තා. ඉරු සතුටින් හිටියේ. ජීවිතේ නැතිවුණු ආදරේ දෙන්න ආපු හීනයක් විදියට මම බාරගත්තා, ආදරේ දේශය බේරගන්න ආපු දියසෙන් කුමාරයා වගේ එයා මාව බාරගත්තා. ඒ ආදරේ නිසා හිතේ ප්‍රශ්න අමතකවෙලා ගිහින් තිබුණා.

ඔය අතරේ දවසක් ඉරුදිකාගේ වාර්තා සේරම අරගෙන ගාල්ල සදර්න් එකට ගිහින් ජීවන්ත මුණගැහුණා. කාලෙකට පස්සෙ හමුවුණු නිසා ගොඩක් කතාකලේ පරණ දේවල්. ඒ අතරේ මගේ ප්‍රශ්නය ගැන කිව්වම ජීවා ඒ වෙනකොටත් ඒ ගැන අධ්‍යනය කරලා තිබුණා. මම වාර්තා ටික දීලා ගෙදර ආවේ හිතේ බලාපොරොත්තුවක් තියාගන්න ඉඩක් හදාගෙනයි.

වැහි වැටී වියලි මග .
තෙතබරිත වූ අරුම
ලෙසම චිත් නුඹ මහිත
වෙලා ඇත තදින්
ඉකිබිඳින ඔය නෙතට
සුව දසුන ලෙස පැමිණ
රැගෙන යන්නම් මගේ
ලොවට නුඹ වෙනුවෙන්
තැනුව...

කාලෙකට පස්සේ පරණ මහජන බැංකුවේ ඩයරියක කවියක් ලියන්න හිතුනේ හිතේ හැම බලාපොරොත්තුවක්ම තැන්පත් කරලයි.

************************************************

"..හෙලෝ..."

"...හෙලෝ මචං සදීප ...මම ජීවන්ත..."

නිරුදක කතරකට වැටුන පොද වැස්සක් වගේ ජීවාගේ කටහඬ මට ඇහුණා. දවස් ගාණක් තිස්සේ ජීවා කතාකරනකම්ම බලන් හිටියේ අතරමැද කතාකරලා ජීවාට කරදරයක් වෙන්න නොහිතුණු හින්දයි.

"...ඔව් මචං ජීවා කියපං..."

"...මචං මම ඉරුදිකාගේ රිපෝර්ට් සේරම චෙක් කලා...."

එහෙම කියලා ජීවා නිහඬවෙද්දි හිත සොහොන් පිට්ටනියක් වගේ වුණා.

"... ඒ රිපෝට්ස් වලට අනුව ටිකක් බරපතලයි..ඒත් දැන් හරිනම් එයාගේ තත්වය ටිකක් සාමාන්‍ය අතට හැරිලා තියෙන්න ඕන.මොකද මේකේ නියම කරපු ට්‍රීට්මන්ස් වලට අනුව තත්වේ නොර්මල් නම් අපිට වැඩිදුර ප්‍රතිකාර පටන් ගන්න පුළුවන්..."

තත්වේ බරපතලයි කිව්වට පස්සේ ඇහුණු වචන ටිකත් එක්ක හිත යන්තම් හැදුනා.

“..මගේ යාළුවෙක් ඉන්නවා ඉන්දියන් ඩොක්ටර් කෙනෙක්...අනූපම් නායිදූ කියලා..මිනිහත් එනවා ලංකා හොස්පිටල්ස් එකට..මම එයත් එක්කත් මේ ගැන කතා කලා..අනූපම් පවා කියනවා ආයෙත් ට්‍රීට් කරන්න පටන් ගන්න එක වඩා හොඳයි කියලා..ඔහොම ඉන්න දෙන එක ටිකක් ඩේන්ජර් මචං...“

ඒ වචන ටිකත් එක්ක ඇඟ හීතල වෙලා ගියා. සාමාන්‍ය විදියට ජීවත් වෙනකොට මේ ලෙඩේ හරියයි කියලා හිතුවට ඒකේ අනිත් පැත්ත වෙන්න යන එක ගැන ඇහුවම හිත පුදුම විදියට අසරණ වුණා. කියන්න වචනවත් කටට ආවෙ නෑ.

“..මචං දැන් අපි...මොකද කරන්න ඕන...“

“..සදීපයා..පුළුවන් තරම් ඉක්මණට..එහෙම කිව්වට ලොකු හදිස්සියක් නෑ..දවස් කීපයක් ඇතුලත කෙල්ලව අපේ හොස්පිටල් එකට ඇතුල් කරන්න. වියදම් ගැන එච්චර ප්‍රශ්නයක් කරගන්න එපා..ඊත් අපි ට්‍රීට් කරන්න පටන් ගන්න එක හොඳයි..අනූපම් මට හෙල්ප් කරාවි..“

ඇත්තටම ජීවා මේ වෙලාවෙ කරන උදව් කියලා නිමකරන්න බෑ. මගේ හිත තීරණය කලා කොහොමහරි ඉරුදිකාව ආයෙත් බෙහෙත්කරන්න යවන්න ඕන කියලා.

“..නෑ මචං වියදම් ප්‍රශ්නයක් නෑ..කොහොමහරි කරලා කෙල්ලව බේරලා දීපන් බං..මගේ පණ බේරනවා වගේ තමයි ඒකත්...“

“..මට තේරෙනවා සදීප..උඹ මම කියන විදියට වැඩේ කරලා ඇඩ්මිට් කරන්න කලින් මට කෝල් එකක් දීපන්..මම සේරම ඇරේන්ජ් කරන්නම්...“

“..ගොඩක් පින් බං උඹට...“

*************************************************

මතුවී ඇති තත්වය ගැන කතාකරන්න ඉරුදිකාගේ අම්මයි, අයියයි දෙන්නටම කතාකරලා මම දෙන්නම ඉන්න දවසක් බලලා තුඩාවට ගියා. ඉරු හිටියේ පිටිපස්සේ වැඩක. අපි එළියේ ඉඳන් තත්වය ගැන කතාකලා. මම ජීවා කියපු දේවල් අම්මටයි ධනංජය අයියටයි පැහැදිලි කරලා දුන්නා.

''....අනේ පුතේ මම කැමතිනෑ කෙල්ලව ආයෙත් ඔය ඉස්පිරිතාලගානේ නවත්තන්න..''

අම්මගේ හිතේ මේ ගැන ලොකු බයක් තිබුණා. ඒනිසා අම්මා මේ ගැන මුලින්ම විරුද්ධ වුනා. ඒත් මම හැමදේම පැහැදිලිකලා.

''..අම්මේ ජීවන්ත මගේ හොඳ යාළුවෙක්..තව එයාට ඉන්දියන් ස්පෙෂලිස්ට් කෙනෙක් උදව් කරනවා...අපිට බය නැතුව ඉරුව ට්‍රීට්මන්ට්ස් වලට යවන්න පුළුවන්...''

මගේ කතාව අයියා යම්තාක් දුරට අනුමත කලා.

''..මට තේරෙනවා මල්ලි..ඒත් නංගිට ඔපරේෂන් එකක් කරන්න ගිහින් එයාගෙ ජීවිතේට මොනවා හරි වුනොත්..''

ඒ ප්‍රශ්නෙත් එක්ක මමත් ගල්ගැහුණා. ඒත් එක්කම ජීවා කියපු කතාව මතක් වුනා.

''..එයාගේ ජීවිතේට තියන ලොකුම අවදානම මෙහෙම බෙහෙත් නොකර ගෙදර තියන් ඉන්න එක කියලා ජීවන්ත කියනවා..ඒක නිසයි එයාව ඇතුල් කරන්න කිව්වේ..මෙහෙම හිටියොත් ඉරුව කොහොමත් අපිට නැතිවෙයි අම්මේ...''

පවුලේ දරුවෙක් වගේ මගේ කතාවටයි, මගේ කැපවීමටයි ඉරුගෙ අම්මගේ ඇස්වලට කඳුළු ඇවිත් තිබුණා.

''..ඒත් දරුවෝ දුවට මොකක් හරි වුනොත්...''

''...අම්මෙ එහෙම අසුභවාදීව හිතන්න එපා..අපි මේ වෙලාවෙ හිත හයිය කරන් ඉන්න ඕන..මම ඉරුගෙ වගකීම ගන්නවා..අම්මේ ඉරුව ඇඩ්මිට් කරන්න කලින් මම එයාව බඳින්න කැමතියි..''

මගේ කතාවට අම්මයි අයියයි මූණට මූණ බලාගත්තා. ඒ දෙන්නට මගේ කතාව අදහගන්නත් බැරිවුනා.

“..නෑ නෑ..පුතේ අපිට එහෙම අවිස්වාසයක් නෑ..ඒ වගේම මෙහෙම හදිස්සියට ඒවා කරන්න ඕනත් නෑ..බුදුන්ගෙ සරණින් දරුවට හොඳවුනොත් අපි ඒවා ගැන බලමු...“

ධනංජය අයියා බොහොම හැඟීම්බරව එතනින් පිටවුනේ මගේ පිටට තට්ටු කරලා යමක් කියලා.

“...හැමදේම හරියට වුනොත් නංගි උඹට ඇරෙන්න ලැබෙන්න අයිති කිසිම කෙනෙක් මේ ලෝකෙ නෑ මල්ලි...මේ ආත්මෙ විතරක් නෙවෙයි හැම ආත්මෙකම..“

ඒ හැඟීම්බර වචන මාව තවත් ශක්තිමත් කලා. කොහොමහරි දෙන්නවම කැමතිකරගන්න ලැබීම ලොකු හයියක් වුනා. යන්න කලින් මම ගිහින් ඉරුව බැලුවා.

“...මොනවද ඔච්චර තුන්දෙනා එකතුවෙලා කතාකරේ..කුමන්ත්‍රණයක් වත්ද?..“

ඉරු හිනාවෙලා බොහොම සැහැල්ලුවෙන් ඇහුවා. ඔය සැහැල්ලුවෙන්ම අපිට ජීවත් වෙන්න ලැබුණ නම් කියලා හිතුනා.

“..නෑ ඉරු මම ඔයාට කිව්වේ අර මගේ යාළුවා ඩොක්ටර් ජීවන්ත එයා කතාකලා..“

“...මොකද අයියෙ එයා කිව්වේ..මම ඉක්මනටම මැරෙයි කිව්වද?..“

මගේ මූණ කළු වෙනවා දැක්කම ඉරුට හිනහත් ගියා.

“..ආයෙත් ඔය කතාව කියලා මගෙන් ගුටි කන්න එපා..ඔයා විතරද ඇයි මම ඇල්ටො පොඩ්ඩගේ යද්දි හැපිලා මලොත්...“

“..අපොයි කියන කතා..හරි හරි දැන් ඕක අමතක කරමු..ඉතින් ඩොක්ටර් මොකද කිව්වේ..“

‘‘..ආයෙත් ට්‍රීට්මන්ට්ස් පටන් ගන්න කිව්වා..ඔයා ඔහොම ඉන්න එක හොඳ නෑ කිව්වා..‘‘

ඉරුගේ මූණ හොඳටම නරක් වුනා.

‘‘..අනේ මටනම් බෑ අයියේ ආයෙත් ඉස්පිරිතාල ගානේ යන්න...‘‘

ඉරු නහයෙන් අඬන්න ගත්තටම මම කියලා කියලා යන්නම් කැමති කරවා ගත්තා.

********************************************

ජීවාට කතාකරලා දින වෙන්කර ගත්තා. ගමන සූදානම් කෙරුවා. ගිහින් නවතින්න සූදානම් කරගත්තේ ඉරුගේ පුංචි අම්මගේ ගෙදර. රාජගිරියේ පිහිටා තිබුණු ගෙදරට යන්න කට්ටිය සූදානම් වුනා. මගේ ඇල්ටෝ පොඩ්ඩා ගමනට සූදානම් කරගෙන මම තුඩාවට ගියා. ධනංජය අයියා හා අම්මා හැමදේම පිළිවලට ලෑස්ති කරගෙන තිබුණා.

‘‘..මම නංගිට කෝල් කලා අද උදේ පුතේ...එහේ සේරම හරි...‘‘

මම ගෙදරට යද්දිම ඉරුගෙ අම්මා කිව්වා. බඩු සේරම සූදානම් කරලා තිබුණා. ධනංජය අයියා සූදානම් වෙමින් හිටියා. ඉරු ලස්සන සල්වාර් එකිකින් සැරසිලා හිටියා. මූණනම් එච්චර හොඳ පාටක් තිබුණෙ නෑ. හැමෝම ටිකක් විතර බයවෙලයි හිටියේ.

‘‘...මම බඩු ටික පටවන්නම්...‘‘

ධනංජය අයියා හැම දේම වාහනේට පැටෙව්වා. ගෙදර සේරම දොරවල් වහලා අපි එළියට බහින්න පිටත් වුනා. ඉරු යන්න කලින් තාත්තගේ පින්තූරෙට වඳිනකොට අම්මගේ ඇස්වල කඳුළු පිරුනා. යන්න කලින් ඉරු මුළු ගේ දිහාම බලලා දිගු සුසුමක් පිටකරේ හරියට අන්තිම සැරේට ගෙදරින් පිටවෙනවා වගේ. මගේ හිතට ඒ බැල්ම එච්චරම සුබ වුනේ නෑ. මම ඉරුවත් අරගෙන එළියට එන්න ආවා. අපි හතරදෙනාම සාලෙන් පිටවෙලා එන්න ආවා.

ඒත් එක්කම සාලෙ පැත්තෙන් ලොකු සද්දයක් ඇහුණා. ගමන යන්න ගියපු අපි ආයෙත් හැරිලා සාලෙට ආවා. සාලෙට එද්දි කට්ටියම දැක්කේ ටීපෝ එක උඩ තියලා තිබුණු ඉරු ගේ ලස්සනම රාමු කරපු පින්තූරේ බිම වැටිලා වීදුරු කටු හැම තැනම විසිරිලා තියනවා. අපි තුන්දෙනාම මූණට මූන බලාගත්තා මිසක් කියන්න දෙයක් ඉතිරිවුනේ නෑ.

ඉරුදිකා හෙමින් හෙමින් ගිහින් මූණ බිමට බරකරන් පින්තූරෙ අතට ගත්තා. තමන් හිනාවෙවී ඉන්න තමන්ගෙම පොටෝ එක දැන් කුඩුවෙලා ගිහින්. ඉරු පින්තූරය ආයෙත් ටීපෝ එක උඩ තියලා යන්න ආවා.

රාජගිරියේ නිවසට යනකන් අපි හතරදෙනාම හිටියේ හරියට ගොළුවෙලා වගේ. වචනයක් හුවමාරුවුනේ ගොඩක් අඩුවෙන්. ගෙදරින් පිටවෙද්දිම මුහුණ දෙන්නට වුණු අසුභදායී සිදුවීම නිසා හැමෝම හිතින් බයවෙලා වගේ හිටියේ. ටිකක්හරි දිරිමත් හිතක් තිබුණු ධනංජය අයියා පවා මේ සිදුවීමත් එක්ක ගොඩක් කැළඹීමට පත්වෙලා හිටියා. ඒත් ඉරුදිකා මේ කිසිදෙයක් නොදැනුනා වගේ වාහනේ පිටිපස්සේ අසුනේ කවුලුවෙන් පිට බලන් යන විදිය දැක්කම මට පුදුමත් හිතුනා. කණ්ණාඩියෙන් එයා දිහා බලද්දි එක සැරයක් එයා ඒක දැක්කා. සුපුරුදු හීන් හිනාව මූණේ ඇඳුනෙ ඔයා බයවෙන්න එපා සදීප අයියා..මරණෙටවත් අපි දෙන්නා වෙන් කරන්න බෑ කියනවා වගේ. වෙලාවකට පුදුමත් හිතෙනවා මේ කෙලපොඩ්ඩ ගැන.

ඉඳුරුවේ සිංහරාජ හෝටලයෙන් කෑම කෑවට හිතේ පිරියකින් කෑවෙ නෑ කියලා හැමෝටම දැනුනා. රාජගිරියෙ පුංචි අම්මලගෙ ගෙදරට එද්දි ටිකක් දවල් වෙලා. එයාලා බොහොම ආදරෙන් අපිව පිළිගත්තා. පුංචි අම්මා හා බාප්පා ඇරෙන්න එහේ හිටියේ පාසල් යන ඒ දෙන්නගේ එකම කොළු පැටියා විතරයි. ඒ දෙන්නාගේ ප්‍රතිචාර වලින් එයාලා ඉරුට කොච්චර ආදරේද කියලා මට ගියපු වෙලාවෙ ඉඳන් දැනුනා.

“..මේ පුතා ඉන්න එක ලොකුදෙයක් අක්කලාට..අනේ මේ දරුවට රත්නත්තරේම පිහිටයි...“

පුංචි අම්මා දවල් කෑම මේසෙදි මම දිහා බලලා කිව්වේ හදවතින්මයි. ඒ කතාවට මගේ හිතත් ටිකක් විතර උණුවුණා.

“..ඔව් නංගි..අපි බෙහෙත් අතඇරලා දාලා තියෙද්දි මේ දරුවා තමයි හැමදේටම මහන්සි වුනේ..අපි පහුගිය ටිකේ ඉස්පිරිතාල ගානෙ දුවලා හති වැටිලමයි හිටියේ..“

කලින් ඉරුදිකා ජාතික රෝහලට ගෙනාපු වෙලාවෙත් අම්මලා නැවතිලා ඉඳලා තියෙන්නේ මෙහේම තමයි. අම්මා ඒ උදව් පදව් සේරම මතක් කරා.

ජීවන්ත ඉරුදිකාව එක්කගෙන එන්න කිව්වේ එදා හවස. ඉතින් හවස ගමන යන්න හිතට මහා බයක් දැනුනත් හැමදේම ඉරුගෙ ඇස්දෙක දිහා බලලා අමතක කලා.

හවස ලංකා හොස්පිටල්ස් වෙත ගිහින් ඉරුදිකා එක්කම ජීවන්ත මුණ ගැහුනා. ජීවන්ත යාළුවෙක් වෙලා මේ හැමදේම කරලා දෙන්නේ සංසාරෙ කොහේදි හරි කරපු උදව්වක් ගෙවන්න වෙන්න ඇති කියලා මට හිතුනා. ජීවන්ත විවිධ ආකාරයෙන් ඉරුව පරික්ෂා කලා. ස්කෑන් කිරීමත් කලා. ඒ අතරේ තවත් වෛද්‍යවරයෙක් එකතුවුනා.

“...සදීප මේ ඩොක්ටර් අනුපම් නායිදු..මම ඔයාට කිව්වේ..“

“... Anupam this is my one of best friend in my school time..Mr. Sadeepa..“

“...Hello Sadeepa..nice to meet you..“

ඩොක්ටර් අනුපම් අපි දෙන්නම අඳුනගත්තා..පස්සේ එයාගෙ මතය කියන්න ගත්තේ ඉරුදිකාගේ වාර්තා නැවතත් පරික්ෂා කරලා බලලා.

“...Actually my point of view is this is not a kind of difficult one..but she has to be stronger than previous time..so we'll be able to examine further about this..“

“..yes doctor..do you think she will be able to get some relief after this operation..“

මම මගේ ඇත්තටම හිතේ තිබුනු ප්‍රශ්නෙ ඇහුවා.

“.. yes..of course we expect that..this operation is difficult..but we know we can go through this..Jeevantha will explain all the things..don't be afraid both of you..“

ඇත්තටම ඩොක්ටර් අනුපම්ගේ වචන වලින් හිත ගොඩක් හැදුනා. අවසානයේ සැත්කම සඳහා දින දුන්නේ දිනකට පසුවයි. එය එකම සැත්කම නොවෙන්න පුළුවන් කියලා ජීවා කිව්වා.

හවස ගෙදර ඇවිත් සියල්ල පැහැදිලි කරාම අම්මගෙත් ටිකක විතර බිය පහව ගියා. ඒත් සියල්ලම නෙවෙයි.

**************************************************

"...අයියේ..මාත් එක්ක හවස පොඩි ගමනක් යන්න එනවද?.."

කොළඹ ගිහින් පහුවෙනිදා හවස මම එළියේ වාඩිවෙලා පත්තරයක් බලද්දි ඉරූ ඇවිත් මගේ උරේට අතක් තියලා ඇහුවා. ඒ වෙද්දි ධනංජය අයියත් කොහේදෝ ගිහිල්ලා හිටියා. මම ඉරූ මගේ උරේ තියපු අත අරගෙන ඒ මූණ දිහා බැලුවා.

"..කොහේද මගේ කෙල්ලට යන්න ඕන?..."

මගේ හුරතල් වචන වලට හැමදාමත් කම්බුල් රතුවෙන ඉරූ මගේ ළඟට ආවා.

"..මට බෙල්ලන්විල පන්සලට යන්න ආසයි..."

ඉරූ මගේ ඇස්දෙක දිහා බලාගෙන කිව්වා.

"...ඉතිං බබා අද මෙහේ පන්සලේ හවස බෝධි පූජාවක් ලේස්ති කරානේද පුංචි අම්මා?..."

"..කමක් නෑ ගිහින් එමු..මම අම්මට කියන්නම්."

හවස 4 ට විතර දෙන්නම යන්න පිටත් වුනා. ඉරූ ඇඳන් හිටියේ හොඳට මතක හිටින ඇඳුමක්. දිග සුදු සායක් හා ගොඩක් චාම් හැට්ටය ඉරූ සමන් පිච්ච මලක් වගේ මගේ ලග පිපිලා හිටියා. පාක් එකේ වාහනේ නතර කරලා මල්,හඳුන්කූරු අරගෙ අපි දෙන්නා අත් අල්ලගෙන හෙමින් හෙමින් බෙල්ලන්විල පන්සල ඇතුලට ගියා.

මල් පහන් පූජ කරලා ගොඩක් වෙලා අපි දෙ න්නම එක තැනකට වෙලා වැන්දා. ජීවිතේ පලවෙනි වතාවට ඉරු එක්ක පන්සලකට ආවත් ඒක එච්චරම හිත නිදහස් දවසක් නොවීම හිතට දැනුනා. පස්සෙ අපි දෙන්නා ගොඩක් පන්සල වටේම ඇවිද්දා. එක තැනක අපි නැවතිලා වාඩි වුනා. ගොඩක් සෙනග විහාර භූමිය පුරා එහෙ මෙහෙ යනවා.

‘‘..සදීප අයියේ..දෙයක් කියන්නම්..‘‘

මම වාඩිවුණු සීමා ගල අසලින්ම මගේ ඇගටම හේත්තුවෙලා වාඩිවුණු ඉරුදිකා මගේ අතක් අල්ලන් කිව්වා.

‘‘..කියමුකෝ බලන්න ඉතිං..‘‘

මම කිව්වේ ගොඩක් ආදරෙන් එයා ලංකරගන්න ගමන්.

‘‘..මට පොරොන්දු වෙන්න මට මොනවා හරිම වුනොත් ඔයා මට වඩා ගොඩක් හොඳ කෙනෙක් ඔයාගෙ ජීවිතේට ලංකරගන්නවා කියලා...‘‘

ඉරුගේ වචනයි, ස්වරයයි දෙකම මාව ගොළුකරා,අසරණ කලා. ඒ මදිවට හිතට තරහකුත් ආවා.

‘‘..මගෙන් එහෙම පොරොන්දු ගන්න එපා..ඔයාට මොකුත් වෙන්නේ නෑ..මම එහෙම වෙන්න දෙන්නෙත් නෑ..‘‘

මම කිව්වෙ ටිකක් තරහින් ඉරුගෙ අත අල්ලලා.

‘‘..නෑ අනේ පොරොන්දු වෙන්නකෝ..නැත්නම් මම හෙට ඔපරේෂන් එකට යන්නෑ..ඕන දෙයක් වෙද්දෙන් කියලා මාතර යනවා..‘‘

මාතර කෙල්ලන්ගේ පුරුදු මුරණ්ඩු කම අඩුවක් නැතුව තියනවා කියලා පෙන්නන්න වගේ ඉරු මුරණ්ඩු උනා. ඒත් මාතර කොල්ලෙක් විදියට එහෙම පොරොන්දු වෙන්න පුළුවන්ද?..

“..බෑ බෑ..කවදාවත් මම එහෙම පොරොන්දු වෙන්නෙ නෑ..මම දන්නෑ ඉතිං ඔයා හෙට නොගියොත් මට තමයි හැමෝගෙන්ම බැනුම් අහන්න වෙන්නේ.“

මේ කොල්ලත් එක්ක කතාකරලා දිනන්න බැරිබව දන්න නිසා ඉරු පාඩුවෙ පොරොන්දු ගන්න එක නතර කරලා මගේ අතක එල්ලුනා. හවස ඉරපායන ලස්සන බලාගෙන අපි දෙන්නා තුරුල්වෙලා ගෙදර ආවා. ඒ අන්තිම දවසටද එහෙම ඉන්න වෙන්නේ කියලා හිත ගොඩක් ප්‍රශ්න කලා.

**************************************************

“..සදීප සර් පොඩ්ඩක් හෙට ඇවිත් චෙක් ටික සයින් කරලා දෙන්න පුළුවන්ද..අද බොස් මගෙන් ඇහුවා..ඒවා අර්ජන්ට් ලු..“

නරක වෙලාවට මොනවා වෙනවද දන්නෑ කියන්න වගේ එදා රෑ මොකක්දෝ හූනියමක් පාත්වුනා. ඔෆිස් එකට හෙට යන්න වෙනවා කියලා ඒ පණිවිඩෙන් තේරුනා. ඒත් ඉරු හෙට ඔපරේෂන් එකට ගනිද්දි මම නොහිට කොහොමද. මම රෑ අම්මටයි අයියටයි කිව්වා. ඉරුට කිව්වෙ නෑ.

“...මල්ලි ඒ වැඩේට යන්න මමයි, බාප්පයි ඉන්නවනේ..මේ වැඩ නිසා රාජකාරි වැඩ මිස් කරන්න එපා කොල්ලෝ..“

අයියා කිව්වේ දරාගන්න බැරි සහෝදරකමක් හිතේ තියාගෙන.

“..හරි අයියා..ඉරු උදේ වෝඩ් එකට ගත්තම මම යන්නම්.මම හවස ආයෙත් එනවා..ඒත් ඉරුට කියන්න එපා මම ගියා කියලා..එයාට සිහිය එද්දි මම කොහොමහරි ලගට එනවා.“

පහුවෙනිදා පාන්දර ඉඳලම හිතේ තිබුණු අනියත බයත් එක්කම කට්ටියම සූදානම් වුනා. මොකක්දෝ නුහුරු දෙයක් හිතේ හොල්මන් කරා. රෝහලට යන්න කලින් ඉරු සේරටම වැන්දි. වඳින් වඳින අය අඩද්දි මට හිතාගන්න බැරිවුනා. ඉරු මටත් වැන්දා.මගේ ඇස්දෙකට කඳුළු එද්දිත් මම හිනාවෙලා මගේ කෙල්ලට ශක්තිය දුන්නා.

උදේ දහයට ඉරු වෝඩ් එකට ගන්න ජීවා ඇවිත් හිටියා. සියලු දේ සූදානම් කරලා ඔපරේෂන් එකට අවශ්‍ය දේ සූදානම් කරන කාමරේට එක්ක යන්න හදද්දි ඩොක්ටර් අනුපම් ආවා. මම ඉරුට ලංවෙලා අත තදින් අල්ල ගත්තා.

“..සේරම හරියයි මගේ වස්තුවේ..ඔයා ඉක්මණට හොඳවෙලා එන්න..අපි ඉක්මණටම අපේ වෙමු..“

මගේ අත තදින් අල්ලගෙන ඉරු හිනාවුනා.නෙත් අග නොවැටුනු කඳුලක් තියාගෙනම ඉරු ට්‍රොලියෙන් මගේ ඇස්මානෙන් පිටවුනේ හිතට මහා බරක් තියලා. අනිත් හැමෝම කඳුළු පුරවගෙන බලන් ඉඳිද්දි මගේ කෙල්ල ඔපරේෂන් තියටර් එකේ හිටිද්දි මම කොහොම යන්නද? ඔපීස් එකෙන් සැරින් සැරේට කෝල්ස් එනවා. ජොබ් එක දමලා ගහන්න හිතුනා. ඒත් හිත හදන් මාතර එන්න පිටත් වුනා. මාතරට එද්දි හවස් 2.30

****************************************************

වැඩ කටයුතු ඉවරකරාට හිත තිබුනේ කොළඹමයි. වැඩ නිසා ඇමතුමක් දෙන්නවත් ඉස්පාසුවක් ලැබුණේ නෑ. අන්තිමට යන්තම් ගැලවුනේ හවස 4 ට. වාහනේට නැගපු ගමන් ධනංජය අයියට කෝල් එකක් ගත්තා.

“...කොහොමද අයියේ ඉරුට?..“

“...තාම දන්නෙ නෑ මල්ලි..එකට විතර ඔපරේෂන් එකට ගත්තේ. අර ඔයාගෙ යාළුවයි, ඉන්දියන් ඩොක්ටයි තව ඩොක්ටර්ස්ලා දෙන්නෙක් එක්ක ඇවිත් කතාකරලා තමයි ගියේ තියටර් එකට..අපි තවම එළියේ..“

“..එහෙමද අයියා..මම මේ එනගමන්..මම පුළුවන් තරම් ඉක්මනට එනවා..“

“..එහෙම කියලා රේස් එන්න එපා කොල්ලෝ...අපිට උඹත් වටිනවා මල්ලා...“

හදවතින් කියපු ඒ කතාවට ඇහුම්කන් දෙන්න හිත මෙලෙක්වුනේ නෑ. ඇල්ටෝ පොඩ්ඩා වේගයෙන් ඇදුනා. හවස 7 විතර වෙද්දි මම හිටියේ මොරටුව හරියේ..වාහන වේගයෙන් යනවා. ටිකක් නතර කරලා නැවතත් අයියට ඇමතුමක් ගත්තා.

“... අයියා ඉරු ආවාද?..ඉස්පාසුවක් නැතුව මම ඇහුවා.“

“..ඔපරේෂන් එක ඉවර කරලා ඩොක්ටර්ස්ලා ටික දෙනෙක් දැන් ගියා..තාම මල්ලිගේ යාළුවා ආවෙත් නෑ..තාම විස්තරයක් නෑ මල්ලි“

වෙලාවකට මට හිතුනා මෙහෙම කියන්නේ මගේ හිත හදන්නවත්ද කියලා. නැවතත් වාහනේ වේගවත් වුනා. කොරළවැල්ල හරියෙදි කැබ් එකක හැප්පෙන්න ගිහින් නූලෙන් ගැලවුනේ. ඒත් මට ඕන වුනේ ඉක්මණට ඉරු ළගට යන්න.

රෑ 8 ට ලංවෙද්දි මම රෝහල තුලට ආවේ වාහනේ වත් අගුලුදාන්නේ නැතුව දුවගෙනයි. මම යද්දිත් අයියයි, අම්මයි, පුංචි අම්මයි අවිනිශ්චිත විදියට බලං ඉන්නවා.

“..අයියේ ඉරු කෝ..?? මම ප්‍රශ්න කලා.“

“..තාම ගෙනාවෙ නෑ මල්ලි…ඩොක්ටර් ආවෙත් නෑ…“

මට කිසිදෙයක් හිතාගන්න බැරිවුනා. මම එහෙම්ම තියටර් එක පැත්තට ඉක්මණින් යන්න ගියා. අයියත් මගේ පස්සෙන්ම ආවා..මම කොරිඩෝව දිගේ යද්දි ඈත කොනෙන් මතුවුනේ ජීවාගේ හා අනුපම්ගේ රුවයි. දෙදෙනා ආවේ ලොකු සාකච්ඡාවකයි. දෙදෙනාගේම මුහුණේ සුබ ලකුණක් දක්නට නැතිවුනා….මගේ හදගැස්ම වැඩිවුනා..තව තවත් වැඩිවුනා..

ඒත් එක්කම මම දැක්කේ ජීවාගේ පිටුපසින් ට්‍රොලියක තබාගෙනෙන රෝගියෙක්..මුළු ඇගම සුදු රෙද්දකින් වසා තිබුණු..දෙයියනේ ඉරූ..මගේ ඉරූ කෝ ඔයා..හිතාගන්න බැරි විදියට හිත කෑගැහුවා.

මාව දැකපු ගමන් ජීවාගේ මුහුණ වෙනස් වුනා.තෙහෙට්ටුවකින් වගේ දෙදෙනාම පෙලුනා. මියගිය රෝගියා ගෙන ආ ට්‍රොලිය දෙස මම බැලුවා. එය මා අසල නතර නොකර දිගටම ගෙනගියා.

“…මචං..දැන් තමයි එලියට එන්න ලැබුනේ…ජීවා මගේ උරේට අතක් තබා කිව්වා.“

“..මචං ඉරුට කොහොමද බං…මම බිඳුනු ස්වරයකින් ඇසුවේ මා පසුකර යන් ට්‍රොලිය දෙස බලන ගමන්.“

“..හැමදෙයක්ම හොඳින් වුනා බන්..අපි හිතුවටත් වඩා හොඳින්..ඉරු ගොඩක් හොඳින් ඉන්නවා..දැන් තමයි සිහිය ආවේ…උඹ ඩොකටර් අනුපම්ටයි අලුත් තාක්ෂනේටයි පින්දිපන්..අපිට පුළුවන් වුනා ඉරුගේ ස්නායුවලට බලපෑම් කරපු දේවල් ඉවත් කරන්න..ඉරුට දැන් සනීපයි..“

හිතේ ඇතිවුනු සතුටට කෑ ගහලා උඩ පනින්න හිතුනා. අත්දෙකෙන් එකවරම ජීවා හා අනුපම් බදාගත්තා.

“..Thank you very much..again and again doctor..“

“..it's ok sadeepa..now she is ok..you can talk with her..and also i wish you..“

මට මහා සතුටක් ඉතිරි කරලා ජීවා හා අනුපම් පිටවෙලා ගියා. එතකොටම් අයියා සහා ඒ පිටුපසින් අම්මා සහ පුංචි අම්මා ආවා.

“..අම්මේ ඔපරේෂන් එක සාර්ථකයි..ඉරූ හොඳින් ඉන්නවා..අපේ ඉරූ හොඳින්..අම්මා හා අයියා එකටම මාව බදාගත්තා..හරියටම එක පවුලක් වගේ අපි එකට කඳුළු සැලුවා..“

අපි එක්කෙනා බැගින් ඉරූ බල්නන ගියා දැඩි සත්කාර ඒකකයට. අම්මා සහ අයියා ගියාට පසුව යන්න මම තීරණේ කලා. අයියා ගිහින් ඇවිත් මම ලගට ආවා.

“..උඹව හොයනවා මල්ලි..කෙල්ලට උඹවයි ඕන දැන්..“

මම සතුටු කඳුලු පිහිදමින් ඇතුලට ගියා. මැෂින් ඉවත්කර තිබුනත් හෘද ස්පන්දනය පරික්ෂාකරනය පමණක් ක්‍රියාත්මක වුනා. ඒ අතරින් ඉරූගේ ඇස්දෙක මා දිහා බැලුවා. හීන් හිනාවකින් මට සංග්‍රහ කරා.

“..මගේ රත්තරනේ ඔයාට හොඳයි නේද?..“

කෙල්ල මගේ අතින් අල්ල ගත්තා. සේලයින් කටුවට නොදැනෙන්න මම අත් අල්ල ගත්තා.

“..ඔව් මගේ අයියේ..ඔයාගේ කෙල්ල හොඳන්...ඔයා වෙනුවෙන් තවමත් ජීවත් වෙනවා..“

මම කෙල්ලගේ උරේට ඔළුව තියාගෙන ලොකු සුසමක් හෙලුවා. ඉරූ එයාගෙ කම්බුල මගේ නලලේ වද්දලා ඒ සෙනෙහසේ නොවෙනස් බව කිව්වා.

“..දැන් සේරම හරි මගේ වස්තුවේ..දැන් ඔයා මට ඉන්නවා..මොනවා නැතිවුනත් මට කමක් නෑ..මම ඔයාට ගොඩක් ආදරෙයි කෙල්ලේ..“

ඉරුට ඇඬුම් ආවා.සතුටු කඳුළු බේරෙන්න ගත්තා. අපි නලලට නලල තියන් ඇඬුවා.

“..ඔව් මගේ අයියේ..මමත් මගේ ජීවිතේටත් වඩා ඔයාට ආදරෙයි..ඔයා නිසයි මට ජීවිතේ ලැබුනේ...“

ඉරුගේ වචන මගේ හිත පසාරු කරමින් ආදරේ හොයන් ගියා.

“..මගේ ජීවිතේ ඔයානේ..ඉතින් මට ඔයා නැතුව ජීවත් වෙන්න පුළුවන්ද..අපි මාතර යමු ඉක්මනට..අපේම වෙමු..මුළු මාතරටම ඇහෙන්න කෑගහලා කියමු අපේ ආදරේ..“

නළලට නලල තියන් මුළු ජීවිතේටම ඇතිවෙන්න මමයි ඉරුයි හිනාවුනා.

නුඹ තියන් මේ පපුව මත
තදකරන් හිටි හැම දෙයම
වෙලා නුඹේ හසරැල්ල
ජීවිතයම අරං ඇවිත් මට
ආදරෙයි නුඹට
හදවත පණ ගැහෙනා තුරාවට
හමුවුණා..අනේ හමුවුණා
නුඹ ලඟදී
ජීවිතයම මට

නිමි

හමුවුණා අනේ...හමුවුණා නවකතාව රසවිඳි ඔබ සැමට බොහොමත්ම ස්තූතියි. මෙම නවකතාව පිළිබඳ ඔබගේ අදහස් උදහස් යොමු කරන්න wijaindu@gmail.com